# කාර්යසාධන වාර්තාව

# 2014

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

*නො. 42,*
*ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,*
*තැ.පෙ. 537,*
*කොළඹ - 07.*

# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

## ඉදිරි දැක්ම

*"ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ හා*
*සියළු කෘෂිකාර්මික ඉඩම්වල තිරසාර*
*සංවර්ධනය"*

## මෙහෙවර

*"ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසාර සංවර්ධනය*
*හා*
*සියළු කෘෂිකාර්මිකඉඩම්වලින්*
*ප්‍රශස්ථ ඵලදායිතාවයක් ලබා ගත හැකි වන පරිදි*
*ආයතනික, සහායක, නෛතික හා කළමනාකරණ*
*සේවාවන් සැකසීම හා කාලානුරූපව*
*පවත්වා ගෙන යාම"*

# හැඳින්වීම

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලාංකීය ගොවි ජනතාවට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් 1957 ඔක්තෝබර් 01 වන දින ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද්දේ එතෙක් පැවති ආහාර දෙපාර්තමේන්තුව අහෝසි කරමිනි. 1958 අංක 01 දරණ කුඹුරු ඉඩම් පනතින් බල ගන්වන ලද මෙම දෙපාර්තමේන්තුව මේ වන විට 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හා එහි සංශෝධනයන් අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් ක්‍රියාත්මක වේ.

## අරමුණු හා ප්‍රධාන කාර්යයන්

01. රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති වලට අනුකූලව කෘෂිකාර්මික ඉඩම් යෙදවීමට අදාල විධි විධාන සැලැස්වීම.
02. කෘෂිකාර්මික ඉඩම් හිමියන්, කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවීන් සහ භුක්තිකරුවන්/අඳ ගොවීන්ගේ වගා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන විධි විධාන ක්‍රියාත්මක කිරීම.
03. ගොවි සංවිධාන ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධ නියෝග සෑදීම සහ එම විධි විධාන ක්‍රියාත්මක වීම තහවුරු කිරීම.
04. ගොවිජන සංවර්ධන සභා ස්ථාපිත කිරීම සහ ඒවායේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීම සහ අධීක්ෂණය.
05. දිවයින පුරා පවත්නා සෑම ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයකටම අදාලව කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ තොරතුරු ඇතුලත් කෘෂිකාර්මික ඉඩම් නාම ලේඛන පිළියෙල කර සංශෝධනය හා ප්‍රතිශෝධනය කර පවත්වාගෙන යාම.
06. කෘෂිකාර්මික ඉඩම් වලට අදාල අඳගොවි ගැටළු සහ වෙනත් ගොවි ආරවුල් විසඳීම සඳහා කටයුතු කිරීම.
07. සුළු වාරි කර්මාන්ත සහ ජල ප්‍රභවයන්ගේ ඵලදායීතාවය, ආරක්ෂාව, සංරක්ෂණය සහ කළමනාකරණයට අදාල වන විධි විධාන ක්‍රියාත්මක කිරීම.
08. ගොවිජන සංවර්ධන පනත හා රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති උල්ලංඝනය කරමින් ක්‍රියාත්මක වන පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම.
09. රජයේ කෘෂිකාර්මික හා කාලීන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේදී වෙනත් ආයතන වෙත අවශ්‍යවන්නා වූ ආයතනික, නෛතික, සහායක හා කළමනාකරණ සේවාවන් සැලසීම.

# ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගෙන්.........

අතීතයේ සිට ශ්‍රී ලාංකේය ගොවි ජනතාවගේ පාරම්පරික ඇවතුම් පැවතුම් හා බද්ධව යැපුම් ආර්ථිකයක්ව පැවති මෙරටේ වී වගාව ඇතුළු කෘෂිකර්මාන්තය මේ වන විට සැළකිය යුතු වර්ධනයක් අත්පත් කර ගෙන ඇත . පෙරදිග ධාන්‍යාගාරය ලෙස පැරකුම් යුගයෙහි විරුදාවලිය ලත් අප කුඩා දිවයින එතැන් සිට ක්‍රම ක්‍රමයෙන් දියුණු වී මේ වන විට සහල් අපනයනය කිරීම දක්වා සාඩම්බර ගමනක අවතීර්ණ වී තිබේ.

ඊසාන දිග හා නිරිත දිග මෝසම් වලින් ලැබෙන වැසි දියෙන් අව් වැසි නොබලා යන්ත්‍ර සූත්‍ර හා කරට කර තම කාය ශක්තියෙන් කෙත් වතු අස්වද්දන ශ්‍රී ලාංකීය ගොවි ප්‍රජාව , කෘෂිකර්මාන්තය ක්‍රියාත්මක කරන කොඳු නාරටිය වේ. ඔවුන්ගේ ක්‍රියා දාමය නිසි මාවතකට යොමු කරමින් හා නව කෘෂි තාක්ෂණයෙන් සවි බල ගන්වමින් මහඟු දායාදයන්ද සමග දළ දේශීය නිශ්පාදිතයට සක්‍රීය ලෙසින් දායකවන්නට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට හැකියාව ලැබීම පිළිබඳව සිහිපත් කරනුයේ නිහතමානී ආඩම්බරයකිනි.

2014වසරේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ඉලක්කයන් වෙත පියනැගීමේ ක්‍රමවේදයන් මැනවින් විස්තර කර ඇති 2014 කාර්යය සාධන වාර්තාව මෙලෙසින් එළි දැක්වීමට ලැබීම සතුටට කරුණකි. එමෙන්ම, මෙම කර්තව්‍ය සාර්ථක කර ගැනීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය උපදෙස් හා නායකත්වය නොඅඩුව ලබා දුන් ගරු අමාත්‍ය තුමන්, නියෝජ්‍යඅමාත්‍ය තුමන් හා අමාත්‍යාංශ ලේකම් තුමන් ඉතා ගෞරවයෙන් සිහිපත් කරමි.

එමෙන්ම, 2014පාලන වාර්තාව එළි දැක්වීමට නන් අයුරින් උපදෙස් හා සහය ලබා දුන් සියළු දෙනා හට මාගේ ස්තුතිය පුද කර සිටිමි.

එම්.ඒ.එස්.වීරසිංහ
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

# පටුන

**පිටු අංකය**


- ❖ පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය. **01**
- ❖ සංවර්ධන හා ප්‍රගති පාලන අංශය. **16**
- ❖ ඉංජිනේරු අංශය. **20**
- ❖ ආයතනික සංවර්ධන අංශය **21**
- ❖ ප්‍රවාහන අංශය. **28**
- ❖ නීති අංශය. **29**
- ❖ ගිණුම් අංශය. **33**
- ❖ අභ්‍යන්තර විගණන අංශය. **35**
- ❖ ඵලදා වර්ධන හා අලෙවි අංශය. **36**
- ❖ ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය **38**
- ❖ ජල කළමනාකරණ අංශය. **42**
- ❖ මෙහෙයුම් හා ඇගයුම් අංශය **46**

*ඇමුණුම්.*

- ඇමුණුම **01** **47**
- ඇමුණුම **02** **53**
- ඇමුණුම **03** **59**
- ඇමුණුම **04** **60**
- ඇමුණුම **05** **62**

# 01.පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

## 1.1 ආයතන අංශය.

### 1.1.1.දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව

දීප ව්‍යාප්ත, ඒකාබද්ධ හා දෙපාර්තමේන්තුගත තනතුරු ඇතුළුව මෙම දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාව 15547කි. 2014 වර්ෂය අවසානය වන විට සේවයේ නිරත වූ සංඛ්‍යාව 12568කි. පුරප්පාඩු වූ සංඛ්‍යාව 2979කි.

ප්‍රධාන කාර්යාලයේ කටයුතු සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් තනතුර හා කොමසාරිස් තනතුරු 03ක් ද දෙපාර්තමේන්තුව සඳහා නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් තනතුරු 43ක් ද අනුමත වී ඇත. සමාලෝචන වර්ෂය අවසානය වන විට දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 111 පන්තියේ නිලධාරීන් 07 දෙනකු 11 පන්තියට උසස්වීම් ලැබූ අතර එයින් දිස්ත්‍රික් කාර්යාලවලට නියෝජ්‍ය කොමසාරිස්වරු 05 දෙනකු පත්කර ඇත. දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස් තනතුරු 28ක් අනුමතවී ඇති අතර සමාලෝචන වර්ෂය අවසානය වන විට ගොවිජන සංවර්ධන නිලධාරීන්ගෙන් තරඟ විභාගයක් පවත්වා දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරුන් 24 දෙනකු බඳවා ගන්නා ලදී.

රාජ්‍ය කළමනාකරණ සහකාර අධි පන්තියේ පුරප්පාඩු 24ක් වූ අතර සමාලෝචන වර්ෂය අවසානය වන විට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව 165ක් විය. සමාලෝචන වර්ෂය තුළදී රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට නවක නිලධාරීන් බඳවා ගැනීමේදී මෙම දෙපාර්තමේන්තුවට නිලධාරීන් 28ක් අනුයුක්ත කර ඇත.

### 1.1.2.කාර්ය මණ්ඩල සංවිධාන ව්‍යුහය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධානි ලෙස ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය කාර්ය සාධන මට්ටම පවත්වා ගැනීමට වග කියන අතරම, ඒ සඳහා තමන් යටතේ සේවය කරන විවිධ මට්ටම්වල නිලධාරීන්ට වගකීම් හා බලතල පවරා ඇත.

දෙපාර්තමේන්තුවේ අරමුණු හා අභිමතාර්ථ ලඟා කර ගැනීම සඳහා සහාය ලබා දුන් සමාලෝචන වර්ෂය අවසාන වන විට සේවයේ නිරත වී සිටි දෙපාර්තමේන්තුවට අනුමත විවිධ තනතුරුවල සේවක සංඛ්‍යාව එක් එක් තනතුරු ආශ්‍රිතව පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැකිය.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

සේවක සංඛ්‍යා තොරතුරු2014.12.31දිනට

| අනු අංකය | තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලං.ප.සේ(විශේෂ) | 1 | 1 | - |
| 2 | අතිරේක කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලං.ප.සේ(විශේෂ) | 1 | 1 | - |
| 3 | කොමසාරිස් | ශ්‍රී ලං.ප.සේ I | 3 | **2** | 1 |
| 4 | නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් | ශ්‍රී ලං.ප.සේ | 43 | 36 | 7 |
| 5 | අධ්‍යක්ෂ(ඉංජිනේරු) | ශ්‍රී ලං.ඉ.සේ | 1 | 1 | - |
| 6 | ඉංජිනේරු(යාන්ත්‍රික) | ශ්‍රී ලං.ඉ.සේ | 1 | - | 1 |
| 7 | ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ | 12 | 9 | 3 |
| 8 | ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී ලං.ග.සේ I | 1 | 1 | - |
| 9 | ගණකාධිකාරි | ශ්‍රී ලං.ග.සේ | 13 | 6 | 7 |
| 10 | අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං.ග.සේ | 1 | 1 | - |
| 11 | සහකාර අධ්‍යක්ෂ(සැළසුම්) | ශ්‍රී ලං.ක්‍ර.සම්.සේ | 1 | 1 | - |
| 12 | නීති නිලධාරි | දෙපාර්තමේන්තු | 1 | - | 1 |
| 13 | සහකාර කොමසාරිස් | දෙපාර්තමේන්තු | 28 | 20 | 8 |
| 14 | ගොවිජන සංවර්ධන නිලධාරි(විශේෂ) | දෙපාර්තමේන්තු | 30 | - | 30 |
| 15 | ගොවිජන සංවර්ධන නිලධාරි | දෙපාර්තමේන්තු | 557 | 447 | 110 |
| 16 | පරිපාලන නිලධාරි | රා.ක.ස.සේ. - අධි | 31 | 7 | 24 |
| 17 | භාෂා පරිවර්ථක | භාෂා පරිවර්තක සේවය | 2 | - | 2 |
| 18 | යාන්ත්‍රික අධිකාරි | දෙපාර්තමේන්තු | 2 | 2 | - |
| 19 | තාක්ෂණ නිලධාරි(විශේෂ) | ශ්‍රී.ලං.තා.සේ (විශේෂ) | 22 | 10 | 12 |
| 20 | කාර්මික නිලධාරි | ශ්‍රී.ලං.තා.සේ I<br>ශ්‍රී.ලං.තා.සේ II | 100 | 72 | 28 |
| 21 | කාර්මික නිලධාරි(යාන්ත්‍රික) | ශ්‍රී.ලං.තා.සේ | 5 | - | 5 |
| 22 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | ශ්‍රී ලං.තොරතුරු තා.සේ. | 1 | - | 1 |
| 23 | අයවැය සහකාර | - | 1 | 1 | - |
| 24 | ❖ සංවර්ධනනිලධාරි | දෙපාර්තමේන්තුගත/ සංවර්ධන නිලධාරි සේවය | 247 | 197 | 50 |
| 25 | සංවර්ධන නිලධාරි | සංවර්ධන නිලධාරි සේවය | 2500 | 1975 | 525 |
| 26 | සැළසුම් ශිල්පි | ශ්‍රී ලං.තා.සේ. | 1 | 1 | |
| 27 | පුස්තකාලායාධිපති | පුස්තකාලායාධිපති සේවය | 1 | - | 1 |
| 28 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ | 538 | 373 | 165 |
| 29 | ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු | දෙපාර්තමේන්තු | 557 | 379 | 178 |
| 30 | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර | දෙපාර්තමේන්තු | 10400 | 8728 | 1672 |
| 31 | ක්ෂේත්‍ර සහකාර* | දෙපාර්තමේන්තු | 2 | 1 | 1 |
| 32 | ලඝු/යතුරු ලේඛක* | දෙපාර්තමේන්තු | 15 | 7 | 8 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 33 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී ලං.තො.තා.සේ. | 3 | - | 3 |
| 34 | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | 111 | 98 | 13 |
| 35 | යන්ත්‍ර කාර්මික | දෙපාර්තමේන්තු | 8 | - | 8 |
| 36 | රිය සහයක | දෙපාර්තමේන්තු | 21 | 8 | 13 |
| 37 | මුරකරු | දෙපාර්තමේන්තු | 83 | 59 | 24 |
| 38 | කාර්යාල කාර්ය සහයක | කා.සේ.සේ | 110 | 68 | 42 |
| 39 | සංචාරක බංගලා භාරකරු | දෙපාර්තමේන්තු | 7 | 3 | 04 |
| 40 | කම්කරු* | දෙපාර්තමේන්තු | 17 | 6 | 11 |
| 41 | යන්ත්‍ර ක්‍රියාකරු | දෙපාර්තමේන්තු | 36 | 32 | 04 |
| 42 | යන්ත්‍ර ක්‍රියාකරු සහයක | දෙපාර්තමේන්තු | 32 | 15 | 17 |
| එකතුව | | | **15547** | **12568** | **2979** |

+ අනියම් යන්ත්‍ර ක්‍රියාකරු 1 අනුරාධපුරයේ සිටී.

## 1.1.3. ආයතන කටයුතු.

### (I)2014 වර්ෂය තුළ දීප ව්‍යාප්ත සේවා වල නිලධාරීන්ගේ චිචලායතා පහත පරිදි වේ.

➢ 2014 වර්ෂය තුළදී මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් වලට අදාල තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරුවී ගිය දිනය | ස්ථාන මාරු වී ගිය සේවා ස්ථානය |
|---|---|---|---|
| 1 | ආර්.එම්.එන්. විජේතුංග මයා ශ්‍රී.ලං.ප.සේ. III | 2014.06.23 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය |
| 2 | ඩබ්.එම්.ඩී.කේ. වික්‍රමසිංහ මිය ශ්‍රී.ලං.ප.සේ III | 2014.06.30 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය |
| 3 | ටී.ඒ. ගමගේ මිය ශ්‍රී.ලං.ප.සේ III | 2014.08.06 | සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |
| 4 | බී.එන්.ඩී. කුමාර මයා ශ්‍රී.ලං.ප.සේ III | 2014.01.05 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය |
| 5 | කේ.එල්.එම්.සී. කුලරත්න මිය ශ්‍රී.ලං.ප.සේ III | 2014.11.23 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය |

➢ දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වී පැමිණි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් පිළිබද විස්තර

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරුවී පැමිණි දිනය | ස්ථාන මාරු වී පැමිණීමට පෙරසේවය කළ සේවා ස්ථානය |
|---|---|---|---|
| 1 | පී.එල්.එම්. චතුරංග මයා ශ්‍රී.ලං.ප.සේ III | 2014.09.01 | බුත්තල උප දිසාපති කාර්යාලය |

| | | | |
|---|---|---|---|
| 2 | කේ.ඒ. සුමිත් චන්දන මයා<br>ශ්‍රී.ලං.ප.සේ III | 2014.01.02 | මැතිවරණ දෙපාර්තමේන්තුව |
| 3 | එම්.පී.පෙරේරා මිය<br>ශ්‍රී.ලං.ප.සේ III | 2014.09.04 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය |

➢ 2014 වර්ෂයේ ශ්‍රී.ලං.ගණකාධිකාරී සේවයේ හා ඉංජිනේරු සේවයේ ස්ථාන මාරුවීම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරුවී ගිය දිනය | ස්ථාන මාරු වී ගිය සේවා ස්ථානය |
|---|---|---|---|
| 1 | ටී.ඒ.ඩබ්. නාරායන මිය<br>ශ්‍රී.ලං.ග.සේ III | 2014.05.21 | කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 2 | ආර්.එම්. ජිනදාසමයා<br>ශ්‍රී.ලං.ඉ.සේ II | 2014.11.12 | යෞවන කටයුතු හා නිපුනතා අමාත්‍යාංශය |
| 3 | ඊ.එම්.ආර්.එස්.ආර්. සෙනවිරත්න මිය<br>ශ්‍රී.ලං.ඉ.සේ II | 2014.04.24 | සබරගමුව පළාත් සභාව |

**(II) නව බඳවා ගැනීම්.**

➢ සමාලෝචන වර්ෂය තුළ මෙම දෙපාර්තමේන්තුවට නව පත්වීම් ලබා පැමිණි ශ්‍රී.ලං.ප.සේවයේ නිලධාරීන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | නිලධාරියාගේ නම | සේවය | අනුයුක්ත දිනය |
|---|---|---|---|
| 1 | ඩබ්.ඩී.ආර්.ජේ. රුදිගු මෙවි | ශ්‍රී.ලං.ප.සේ III | 2014.04.02 |
| 2 | වි.පී. පීටර්ස් මිය | ශ්‍රී.ලං.ප.සේ III | 2014.04.02 |
| 3 | ඩී.සී.එන්. අබේසේකර මෙවි | ශ්‍රී.ලං.ප.සේ III | 2014.04.02 |

➢ දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වී පැමිණි ගණකාධිකාරී සේවයේ නිලධාරීන් නිලධාරීන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරුවී පැමිණි දිනය | ස්ථාන මාරු වී පැමිණීමට පෙරසේවය කළ සේවා ස්ථානය |
|---|---|---|---|
| 1 | එම්.ඩබ්.සී. පුෂ්පලතා මිය<br>ශ්‍රී.ලං.ග. සේ III | 2014.03.10 | මුදල් අමාත්‍යාංශය |

➢ දෙපාර්තමේන්තුව වෙත නව පත්වීම් ලබා පැමිණි ඉංජිනේරු සේවයේ නිලධාරීන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | නිලධාරියාගේ නම | සේවය | අනුයුක්ත කළ දිනය |
|---|---|---|---|
| 1 | කේ.දිනේෂ්කුමාරන් මයා ශ්‍රී.ලං.ඉ.සේ III | ශ්‍රී.ලං.ඉ.සේ III | 2014.04.01 |
| 2 | ආර්.එල්.එම්.යූ. රත්නායක මෙවි | ශ්‍රී.ලං.ඉ.සේ III | 2014.04.02 |

- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නව පත්වීම් මෙම වර්ෂය තුළ නොමැත.

## (III)පත්වීම් ස්ථිර කිරීම

- සමාලෝචන වර්ෂය තුළ ගො.ජ.සං. නිලධාරී මුළු පුරප්පාඩු සංඛ්‍යාවෙන් 40% ක ප්‍රමාණයක් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කිරීමට 2013.11.23 දින විභාගයක් පවත්වන ලදී. ඒ අනුව, සම්මුඛ පරීක්ෂණයක් පවත්වා 2014.03.24 දින ගොවිජන සංවර්ධන නිලධාරී 11 ශ්‍රේණියේ තනතුරු77ක් බඳවා ගැනීම් කර ඇත. මුළු පුරප්පාඩු සංඛ්‍යාවෙන් 60% ක ප්‍රමාණයක් බාහිර අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කිරීමට 2014.05.24 දින විභාගයක් පවත්වන ලදි. ප්‍රතිඵල නිකුත්වීමෙන් පසු ඉදිරියේදී ඔවුන් බඳවා ගැනීමට නියමිතය.

- තාක්ෂණ නිලධාරි (විශේෂ) නිලධාරීන් 05 දෙනකු බඳවා ගෙන ඇත.

- ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු - මෙම තනතුරේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට 2014.10.25 දින දීප ව්‍යාප්ත තරඟ විභාගයක් පවත්වන ලදී. ප්‍රතිඵල නිකුත්වීමෙන් පසු ඉදිරියේදී ඔවුන් බඳවා ගැනීමට නියමිතය.

- කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර - මෙම තනතුරේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට 2014.10.25 දින දීප ව්‍යාප්ත තරඟ විභාගයක් පවත්වන ලදී. ප්‍රතිඵල නිකුත්වීමෙන් පසු ඉදිරියේදී ඔවුන් බඳවා ගැනීමට නියමිතය.

- ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලවලට දැනුම්දීමක් කර අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා රියදුරන් 29 දෙනකු බඳවා ගැනීමට කටයුතු කර ඇත.

## (IV)තනතුර අතහැරයාම, ඉල්ලා අස්වීම,මියයාම් ,වැඩ තහනම් කිරීම

සමාලෝචන වර්ෂය තුළ සිදුවූ වෙනස්කම් පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | සේවය හැර යාම | ඉල්ලා අස්වීම | මියයාම් | මුදාහැරීම | වැඩ තහනම් |
|---|---|---|---|---|---|---|
| 1 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 01 | 01 | _ | 03 | _ |
| 2 | රියදුරු සේවය | _ | _ | 01 | 01 | _ |
| 3 | කාර්යාල සේවක සේවය | 01 | - | - | 01 | _ |
| 4 | කෘ.ප.නි.ස | 09 | _ | 03 | 05 | 01 |
| 5 | කම්ටු ලිපිකරු | 02 | 01 | _ | 03 | 01 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 6 | ගො.ස.නි | _ | _ | _ | _ | _ |
| 7 | තාක්ෂණ සේවය | __ | | 01 | | |

**(V)ස්ථාන මාරුවීම්**

දීප ව්‍යාප්ත සේවාවන් හැරුණු විට ඒකාබද්ධ සේවාවල නිළධාරීන්ගේ ස්ථාන මාරුවීම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | ස්ථාන මාරු වීගිය සංඛ්‍යාව | පැමිණි සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 45 | 52 |
| 2 | රියදුරු සේවය | 01 | - |

**(VI) විශ්‍රාම ගැනීම්**

සමාලෝචන වර්ෂය තුළ විශ්‍රාම ගැනීම පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | විශ්‍රාම ගියසංඛ්‍යාව | |
|---|---|---|---|
| | | **වි.වැ.2.17 වගන්තියෙන්** | **වි.වැ.2.12 වගන්තියෙන්** |
| 1 | ශ්‍රී.ලං.ප.සේ | - | - |
| 2 | ශ්‍රී.ලං.ඉ.සේ | 02 | - |
| 3 | සහකාර කොමසාරිස් දෙපා. | 04 | - |
| 4 | රා.ක.ස.සේ | 17 | - |
| 5 | රියදුරු | 04 | - |
| 6 | කා.කා.ස | 01 | - |
| 7 | කම්වු ලිපිකරු | 22 | - |
| 8 | කෘ.ප.නි.ස | 02 | - |
| 9 | කාර්මික නිලධාරී | 01 | - |
| 10 | ගොවිජන සංවර්ධනනිලධාරී | 07 | - |
| 11 | ලඝු යතුරු | - | - |

## 1.1.4. විදේශ සංචාර හා පුහුණු

සමාලෝචන වර්ෂය තුළදී විදේශ ශිෂ්‍යත්ව,සම්මේලන හා වැඩමුළු වලට සහභාගිවීම පහත පරිදි වේ.

A. 2014-05-12 දින සිට 2014-05-31 දින දක්වා කොරියානු සමූහාණ්ඩුවේ පැවැත්වූ (International Samuel I Training program for foreign Leaders – kyungwoon university) පුහුණු වැඩමුළුවට රත්නපුර දිස්ත්‍රික් සහකාර කොමසාරිස් ජේ.ඩී.එන්. ජයකොඩි මහතා සහභාගි වීම.

B. 2014-07-28 දින සිට 2014-08-01 දින දක්වා ඉන්දියාවේ පැවැත්වූ චන්ද්‍රිකා තාක්ෂණය අනුසාරයෙන් නියඟය හඳුනාගැනීම පිළිබඳ වැඩමුළුවට ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර ඒ.ඉසෙඩ්.ජේ. සිංගයාර් මහතා සහභාගි වීම

C. 2014-08-24 දින සිට 2014-09-27 දින දක්වා ජපානයේ පැවැත්වූ (G.T.C Planning of Agricultural policy) පුහුණු වැඩමුළුවට ගාල්ල දිස්ත්‍රික් සහකාර කොමසාරිස් රවි ප්‍රසාද් කළුපහන මහතා සහභාගි වීම.

D. 2014-08-29 දින සිට 2014-09-25 දින දක්වා චීනයේ පැවත් වූ (Seminar of Agricultural and Animal Husbandry Development for Asian and European Countries – 2014) අධ්‍යයන චාරිකාව සඳහා ගම්පහ දිස්ත්‍රික් සහකාර කොමසාරිස් එම්.එල්.එන්. සඳමාලි මිය සහභාගි වීම.

E. 2014-10-01 දින සිට 2014-10-28 දින දක්වා ඉන්දියාවේ පැවැත්වූ (Good Governance and Management of RD Programmers Delivery) වැඩමුළුවට යාපනය දිස්ත්‍රික් නියෝජ්‍ය කොමසාරිස් එම්.පී. ඩිරංජන් මහතා සහභාගි වීම.

F. 2014-09-29 දින සිට 2014-10-04 දින දක්වා ඉන්දුනිසියාවේ පැවැත්වූ දේශගුණ විපර්යාස නිසා කෘෂිකර්ම ක්ෂේත්‍රයට සිදුවන බලපෑම අවම කිරීම සම්බන්ධයෙන් වූ වැඩමුළුවට පහත නම් සඳහන් නිලධාරීන් සහභාගි වීම.
   I. ඉසෙඩ්.ඒ.එම්. ෆයිසාල් මහතා - කොමසාරිස් (සංවර්ධන)
   II. එස්.එම්.ඩී.සී. සමරසේකර මහතා- කොමසාරිස් (සේවා)

G. 2014.10.28 දින සිට 2014.10.31 දින දක්වා චීනයේ බීජිං නුවර පැවැත් වූ නියඟය කල් ඇතිව හඳුනා ගැනීම සඳහා අභ්‍යාවකාශ තාක්ෂණය යොදා ගැනීම පිළිබඳ වූ විදේශ පුහුණුවට ඉංජිනේරු(ජල කළමනාකරණ) ද.දි.ප්‍රභාත් විතාරණ මයා සහභාගි වීම.

H. 2014.11.21 දින සිට 2014.11.26 දින දක්වා ඉන්දියාවේ පැවැත් වූ කිළිනොච්චිය හා මුලතිව් දිස්ත්‍රික්කවල ජල කළමනාකරණය හා කෘෂිකාර්මික ජීවනෝපාය සංවර්ධනය පිළිබඳ වැඩසටහන සඳහා පහත නම් සඳහන් නිලධාරීන් සහභාගි වීම.
   I. ආර්.විජය කුමාර් මයා -සහකාර කොමසාරිස් (මුලතිව්)
   II. කේ.දිනේෂ් කුමාරන් මයා -ප්‍රාදේශීය ඉංජිනේරු

I. 2014.05.28 දින සිට 2014.06.29 දින දක්වා ජපානයේ පැවැත් වූ Farmers Organization Water Management Through Small Water Impounding(Small Dam) Reservoir For Asia වැඩමුළුවට ප්‍රාදේශීය ඉංජිනේරු,එම්.එම්.මුනාස් මහතා සහභාගි වීම.

J. 2014.05.18 දින සිට 2014.05.31 දින දක්වා මැලේසියාවේ පැවැත් වූ (Second Country Study Visit of Master of Public Management (MPM) Program වැඩමුළුවට කොමසාරිස්(සංවර්ධන) ඉසෙඩ්.ඒ.එම්.ෆයිසාල් මහතා සහභාගි වීම.

### 1.1.5.විනය කටයුතු

සමාලෝචන වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ විධිමත් විනය පරීක්ෂණ ආරම්භ කර ඇති සංඛ්‍යාව 64කි. චෝදනා පත්‍ර නිකුත් කිරීමට ඇති විනය පරීක්ෂණ ගණන 30කි. විධිමත් විනය පරීක්ෂණ අවසන් කර විනය නියෝග නිකුත් කිරීමට ඇති ප්‍රමාණය 06කි. සමාලෝචන වර්ෂය තුළදී විධිමත් විනය පරීක්ෂණ අවසන් කර විනය නියෝග නිකුත් කර ඇති ප්‍රමාණය 32කි.

### 1.1.6. පුහුණු හා හැකියාවර්ධන

සමාලෝචන වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කුසලතා,ආකල්ප හා දැනුම වර්ධනය කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ.මේ සඳහා රු.30,000,00.00 ක් වෙන් වී තිබූ අතර වර්ෂය අවසාන වන විට රු.32,020,51.25ක් වැය කර තිබුණි.

| අනු අංකය | පුහුණු විෂය | පුහුණු කළ නිලධාරීන් | පැවැත් වූ කාලය | පැවැත්වූ දිනය | පැවැත්වූ ස්ථානය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලයෙන් කළ පුහුණු වැඩසටහන් | | | | | | |
| 1 | විශ්‍රාම වැටුප් කටයුතු පිළිබඳ පුහුණුව | විෂය භාර රා.ක.ස. සේවයේ හා සං.නිලධාරීන් | දින 02 | 2014.03.06 හා 07 | පොතුහැර පුහුණු ආයතනය | 75 |
| 2 | සිගාස්පුහුණුව | විෂය භාරනිලධාරීන් | දින 02 | 2014.01.12 හා 13 | පොල්ගොල්ල පුහුණු ආයතනය | 50 |
| 3 | නවක ගො.සං.නි. සඳහා වන සේවාරම්භක පුහුණු වැඩමුළුව | නවකගො.සං.නි. | දින 03 | 2014.04.07 ,08 හා 09 | පොතුහැර පුහුණු ආයතනය | 90 |
| 4 | මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණුව | බදුල්ල දිස්ත්‍රික්කයට අනුයුක්ත ගො.සං.නි. හා ගො.සේ.ම.ලිපිකරුවන් | දින 03 | 2014.05.19 ,20 හා 21 | බණ්ඩාරවෙල ගොවිජන සේවා පුහුණු ආයතනය | 55 |
| 5 | මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණුව | මොණරාගල දිස්ත්‍රික්කයට අනුයුක්ත ගො.සං.නි. හා ගො.සේ.ම.ලිපිකරුවන් | දින 03 | 2014.05.26 ,27 හා 28 | පොතුහැර පුහුණු ආයතනය | 90 |
| 6 | විනය කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණුවට සහභාගි වීම | ඩබ්.ඩී.ආර්.ජේ.රුද්‍රිගු මෙය | දින 03 | 2014.08.06 ,07 හා 08 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | - |
| | | එම්.ඊ.වීරසිංහ මෙය | දින 03 | 2014.08.06 ,07 හා 08 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | - |
| | | එම්.එම්.එරංග අතපත්තු මයා | දින 03 | 2014.08.06 ,07 හා 08 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | - |
| | | ජේ.ඒ.දිල්කා දමයන්ති මිය | දින 03 | 2014.08.06 ,07 හා 08 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 7 | චීන කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ එකළස් කිරීම හා ඒ පිළිබඳව යාන්ත්‍රිකපුහුණුව ලබා දීම | දෙපාර්මේන්තු යන්ත්‍ර ක්‍රියාකරුවන් | දින 25 | 2014.07.10 සිට 2014.08.05 දක්වා | බත්තරමුල්ල යන්ත්‍ර එකළස් කරන භූමිය | 30 |
| 8 | විනය පරීක්ෂණ නිලධාරීන් පුහුණු කිරීම | දිස්ත්‍රික් 17ක විනය පරීක්ෂණ නිලධාරීන් | දින 03 | 2014.08.14 ,15 හා 16 | පොතුහැර පුහුණු ආයතනය | 60 |
| 9 | ගිණුම් පිළිබඳ ප්‍රගති සමාලෝචන වැඩමුළුව | ප්‍ර.කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්,මාණ්ඩලික සහකාර හා විෂය භාරනිලධාරීන් | දින 01 | 2014.08.26 | ප්‍රධාන කාර්යාලය | 75 |
| 10 | මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණු වැඩමුළුවක් පැවැත්වීම | මඩකළපුව හා අම්පාර දිස්ත්‍රික්කවල ගො.සං.නි. හාගො.සේ.ම.ලිපිකරුව න් | දින 03 | 2014.12.04 ,05 හා 06 | මඩකළපුව නිව් සන්රයිස් හෝටලය | 80 |
| 11 | නීති පිළිබඳ පුහුණු වැඩමුළුව | ප්‍ර.කාර්යාලයේ හාදිස්ත්‍රික්ක 18ක නිලධාරීන්, | දින 02 | 2014.09.25 හා 26 | පොතුහැර පුහුණු ආයතනය | 90 |
| 12 | ගොවිජන විනිශ්චය සභා නීති පිළිබඳ පුහුණු වැඩමුළුව | ගොවිජන විනිශ්චය සභාව සඳහා නව පත්වීම් ලද නිලධාරීන් හා විනිශ්වයසභා ලේකම්වරුන් | දින 02 | 2014.12.15 හා 16 | පොතුහැර පුහුණු ආයතනය | 65 |
| 13 | ගොවිජන විනිශ්චය සභා අකෘති පත්‍ර සකස් කිරීම සහ යල්පැනගිය නීතිරෙගුලාසි සකස් කිරීම සඳහා වන වැඩමුළුව | සංවර්ධන නිලධාරීන්,ප්‍ර.කාර්යාල යේ නිලධාරීන් | දින 01 | 2014.12.29 | පොතුහැර පුහුණු ආයතනය | 25 |
| **ප්‍රතිපාදන වෙන් කිරීම්** | | | | | | |
| 14 | සැළසුම් කමිටු රැස්වීම | - | දින 01 | 2014.03.17 | ප්‍ර.කාර්යාලය | - |
| 15 | පුහුණු කරුවන් පුහුණු කිරීමේවැඩසටහන (සිංහල) | සිංහල කථා කරන දිස්ත්‍රික්කවල පුහුණුකරුවන් ලෙස යෝජිත සං.නිලධාරීන් | දින 02 | 2014.03.20 හා 21 | පොතුහැර පුහුණු ආයතනය | 44 |
| 16 | පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන (දෙමළ) | දෙමළ කථා කරන දිස්ත්‍රික්කවල පුහුණුකරුවන් ලෙස යෝජිත සං.නිලධාරීන් | දින 02 | 2014.03.27 හා 28 | පොතුහැර පුහුණු ආයතනය | 16 |
| 17 | ගොවිබැංකු පුහුණුව | ගො.සං.නි., සං.නි. හා ගො.සේ.ම.ලිපිකරුවන් | දින 01 | 2014.03.13 | කිළිනොච්චිය දිස්ත්‍රික් කාර්යාලය | 85 |
| 18 | දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුව | කිළිනොච්චිය දිස්ත්‍රික්කයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් | - | - | කිළිනොච්චිය දිස්ත්‍රික් කාර්යාලය | 45 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 19 | පුරන් කුඹුරු නැවත වගා කරලීමේ වැඩසටහන යටතේ තාක්ෂණ නිලධාරීන්දැනුවත් කිරීමේ වැඩසටහන | තාක්ෂණ නිලධාරීන් | - | - | ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය | 34 |
| 20 | ඉංග්‍රිසිඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම | එල්.ඩබ්.පී.යූ.එන්.වීරසූරිය මිය - ගො.සං.නි(උඩුපිල) | - | - | ශ්‍රීලංකා සංවර්ධන පරිපාලන ආයතනය | - |
| | | බී.එච්.මාලා දමයන්ති මිය -ගො.සං.නි.(දොම්පේ) | - | - | | - |
| | | ඩබ්.එම්.ශ්‍රියා හේමමාලි මිය - ගො.සං.නි.(ගලහිටියාව) | - | - | | - |
| 21 | නීති පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම | ගාල්ල දිස්ත්‍රික් ගො.සං.නි. හා දි.කාර්යාලයේ ව්‍යාවස්ථාපිත අංශයේනිලධාරීන් | - | - | වක්වැල්ල පුහුණු ආයතනය | 45 |
| 22 | නීති පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම | ගො.සං.නි.නිලධාරීන් | දින 01 | 2014.08.28 | රත්නපුර දි.කාර්යාලය | 45 |
| 23 | නීති පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම | ගො.සං.නි.නිලධාරීන් | දින 01 | 2014.08.22 | කළුතර දි.කාර්යාලය | 20 |
| 24 | මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණු වැඩමුළුවක් පැවැත්වීම | මඩකළපුව හා අම්පාර දිස්ත්‍රික්කවල ගො.සං.නි. හාගො.සේ.ම.ලිපිකරුවන් | දින 03 | 2014.12.04 ,05 හා 06 | මඩකළපුව නිව් සන්රයිස් හෝටලය | 80 |
| 25 | සංවර්ධන නිලධාරීන් සඳහා වන පුහුණු වැඩමුළුව | මාතලේ දිස්ත්‍රික් සංවර්ධන නිලධාරීන් | දින 02 | 2014.11.17 හා 20 | මාතලේ දි.කාර්යාලය හා අළුගොල්ල ගො.සේ.මධ්‍යස්ථානය | 81 |
| 26 | ජල කළමනාකරණ ඉංජිනේරු පශ්චාත් උපාධි පාඨමාලාව | එන්.එල්.රියාසාත් අලි මහතා(ප්‍රාදේශිය ඉංජිනේරු) | - | - | මොරටුව විශ්ව විද්‍යාලය | - |
| 27 | ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | එම්.ඊ.වීරසිංහ මෙය (සං.කො.-සේවා) | - | - | රුහුණු විශ්ව විද්‍යාලය | - |
| 28 | ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | වයි.අයි.ඩී.ගුණවර්ධන මිය (සං.කො.-කොලඹ) | - | - | රුහුණු විශ්ව විද්‍යාලය | - |
| 29 | රාජ්‍ය පරිපාලන පිළිබඳ පශ්චාත් උපාධිය | ඩී.සී.එන්.අබේසේකර මෙය (සං.කො.-අම්පාර) | - | - | කොලඹ විශ්ව විද්‍යාලය | - |
| 30 | නිලධාරීන් 17 දෙනෙක් සඳහා පරිගණක පුහුණුව ලබා දීම | අම්පාර දිස්ත්‍රික් කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් | - | - | - | 17 |

### 1.1.7. සාකච්ඡා

සමාලෝචන වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්,දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් හා දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පැවැත් වූ සාකච්ඡා පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | සාකච්ඡා වර්ගය | සහභාගි වුවන් | පැවැත් වූ දිනය | පැවැත් වූ ස්ථානය | සහභාගී සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | නියෝජ්‍ය/සහකාරකොමසාරිස් සාකච්ඡාව | දිස්ත්‍රික්භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2014.02.07 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 100 |
| 2 | නියෝජ්‍ය/සහකාරකොමසාරිස් සාකච්ඡාව | දිස්ත්‍රික්භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2014.03.31 | ආර්ථිකසංවර්ධන අමාත්‍යාංශ ශ්‍රවනාගාරය | 90 |
| 3 | නියෝජ්‍ය/සහකාරකොමසාරිස් සාකච්ඡාව | දිස්ත්‍රික්භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2014.05.09 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 95 |
| 4 | නියෝජ්‍ය/සහකාරකොමසාරිස් සාකච්ඡාව | දිස්ත්‍රික්භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2014.06.10 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 105 |
| 5 | දිස්ත්‍රික්භාර නිලධාරීන් සමඟ විශේෂ රැස්වීම | දිස්ත්‍රික්භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2014.07.04 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 100 |
| 6 | නියෝජ්‍ය/සහකාරකොමසාරිස් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම | දිස්ත්‍රික්භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2014.08.08 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 100 |
| 7 | නියෝජ්‍ය/සහකාරකොමසාරිස් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම | දිස්ත්‍රික්භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2014.09.12 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 100 |
| 8 | ගොවිජනවිනිශ්චය සභා පත්වීම් ලිපි ප්‍රදානය හා දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාරකොමසාරිස් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම | දිස්ත්‍රික්භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2014.11.03 | ආර්ථිකසංවර්ධන අමාත්‍යාංශ ශ්‍රවනාගාරය | 100 |
| 9 | නියෝජ්‍ය/සහකාරකොමසාරිස් සාකච්ඡාව | දිස්ත්‍රික්භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2014.12.22 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 90 |
| 10 | භාණ්ඩාගාරලේකම්තුමා සමඟ සාකච්ඡාව | දිස්ත්‍රික්භාර නි/ස.කො.වරුන් ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2014.12.22 | මුදල්හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 90 |
| 11 | ජාතිකගොවි සංවිධාන බල මණ්ඩල කාරක සභා රැස්වීම | ජාතිකගොවි සංවිධාන බල මණ්ඩල කාරක සභා නිලධාරීන් | 2014.03.25 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 30 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | ස.කො(දෙපා.)පත්වීම්ලිපි ප්‍රදානය | නවකසහකාර කොමසාරිස්වරුන් | 2014.05.28 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 23 |
| 13 | ප්‍රගති සමාලෝචනරැස්වීම | දිස්ත්‍රික් ප්‍රගතිසමාලෝචන නිලධාරීන් | 2014.06.05 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 30 |
| 14 | නීති පිළිබඳ විශේෂසාකච්ඡාව | ස.කො,නීතිසහකාර හා විෂය භාර නිලධාරීන් | 2014.07.07 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 60 |
| 15 | උපාධිධාරීන්ගේරාජකාරී ලැයිස්තු සැකසීම සම්බන්ධ සාකච්ඡාව | නිලධාරීන් | 2014.07.14 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 11 |
| 16 | ශ්‍රිලංකා ජාතික ගොවි සංවිධාන බල මණ්ඩල කාරක සභා රැස්වීම | ගොවිසංවර්ධන නියෝජිතයින් | 2014.08.13 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 30 |
| 17 | ගොවිවිනිශ්වය සභා පිහිටුවීම සඳහාවන සම්මුඛ සාකච්ඡාව | ප්‍රධානකාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | 2014.08.21 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 88 |
| 18 | 2014 වර්ෂයේ ගිණුම් පියවීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් කාර්යාල නිලධාරීන් දැනුවත් කිරීමහා අවශ්‍ය උපදෙස් ලබා දීමේ වැඩසටහන | ප්‍රධානකාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් හා දිස්ත්‍රික් කාර්යාලවල විෂය භාර ලිපිකරුවන් | 2014.12.16 | ප්‍රධානකාර්යාලීය ශ්‍රවනාගාරය | 115 |

**1.1.9. සමාලෝචන වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ අරමුණු ලඟා කර ගැනීම උදෙසා තම දායකත්වය ලබා දුන් දීප ව්‍යාප්ත සේවාවන්වල නිලධාරීන් පහත දක්වා ඇත.**

| අනු අංකය | නිලධාරියාගේ නම | ශ්‍රේණිය | අනුයුක්ත කාර්යාලය | තනතුර |
|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා පරිපාලන සේවය** | | | | |
| 01 | එම්.ඒ.එස්.වීරසිංහ මයා | ශ්‍රී.ලං.ප.සේ. විශේෂ | ප්‍ර.කාර්යාලය | කොමසාරිස් ජනරාල් |
| 02 | එස්.ඩී.කේ.ප්‍රනාන්දු මයා | ශ්‍රී.ලං.ප.සේ. විශේෂ | ප්‍ර.කාර්යාලය | අතිරේක කොමසාරිස් ජනරාල් |
| 03 | ටී.ඒ.ගමගේ මිය | ශ්‍රී.ලං.ප.සේ. III | ප්‍ර.කාර්යාලය | කොමසාරිස්(මා.ස.සං) |
| 04 | එස්.එම්.ඩී.සී. සමරසේකර මයා | ශ්‍රී.ලං.ප.සේ. I | ප්‍ර.කාර්යාලය | කොමසාරිස්(සේවා) |
| 05 | ඉසෙඩ්.ඒ.එම්. ෆයිසල් මයා | ශ්‍රී.ලං.ප.සේ. I | ප්‍ර.කාර්යාලය | කොමසාරිස්(සංවර්ධන) |
| 06 | කේ.ඒ.එස්.සමරජීව මිය | ශ්‍රී.ලං.ප.සේ. III | ප්‍ර.කාර්යාලය | ස.කොමසාරිස් (පාලන) |
| 07 | එම්.ඊ.වීරසිංහ මෙය | ශ්‍රී.ලං.ප.සේ. III | ප්‍ර.කාර්යාලය | ස.කොමසාරිස් (සේවා) |
| 08 | වයි.අයි.ඩී.ගුණවර්ධන මිය | ශ්‍රී.ලං.ප.සේ. III | ප්‍ර.කාර්යාලය | ස.කොමසාරිස්(සංවර්ධන) |
| 09 | නිරෝෂා දීපනි ඊශ්වර මිය | ශ්‍රී.ලං.ප.සේ. III | ප්‍ර.කාර්යාලය | නි.කොමසාරිස්(සේවා) වැ.බ. |
| 10 | එන්.සිවලිංගම් මයා | ශ්‍රී.ලං.ප.සේ. III | මඩකළපුව | ස.කොමසාරිස් |
| 11 | එම්.පී.ඩිරංජන් මයා | ශ්‍රී.ලං.ප.සේ. III | යාපනය | නියෝජ්‍ය කොමසාරිස් |

| | | | | |
|---|---|---|---|---|
| 12 | කේ.පී.ආර්.එච්.සිල්වා මයා | ශ්‍රී.ලං.ප.සේ. III | බදුල්ල | ස.කොමසාරිස් |
| 13 | එන්.පී.ගමගේ මිය | ශ්‍රී.ලං.ප.සේ. III | හම්බන්තොට | ස.කොමසාරිස් |
| 14 | ඩබ්.එම්.ටී.ඩී.කේ.වීරකෝන් මිය | ශ්‍රී.ලං.ප.සේ. III | මහනුවර | නියෝජ්‍ය කොමසාරිස් |
| 15 | ඊ.තයාරුපන් මයා | ශ්‍රී.ලං.ප.සේ. III | කිළිනොච්චිය | ස.කොමසාරිස් |
| 16 | එස්.පුනිත කුමාර් මයා | ශ්‍රී.ලං.ප.සේ. III | ත්‍රිකුණාමළය | ස.කොමසාරිස් |
| 17 | බී.එම්.සී.එච්.කුමාරිහාමි මෙය | ශ්‍රී.ලං.ප.සේ. III | පොළොන්නරුව | ස.කොමසාරිස් |
| 18 | බී.ඒ.එන්.දිල්රුක්ෂි මිය | ශ්‍රී.ලං.ප.සේ. III | කළුතර | ස.කොමසාරිස් |
| 19 | පී.ඒ.මධුසංඛ මයා | ශ්‍රී.ලං.ප.සේ. III | කොළඹ | ස.කොමසාරිස් |
| 20 | ආර්.එම්.ජී.සේනාරත්න මයා | ශ්‍රී.ලං.ප.සේ. III | අනුරාධපුරය | නි.කොමසාරිස් |
| 21 | එම්.සී.මලවිආරච්චි මෙය | ශ්‍රී.ලං.ප.සේ. III | අනුරාධපුරය | ස.කොමසාරිස් |
| 22 | ජේ.ඩී.එන්.එස්.ජයකොඩි මයා | ශ්‍රී.ලං.ප.සේ. III | රත්නපුරය | ස.කොමසාරිස් |
| 23 | පී.ජී.සෝමරත්න මයා | ශ්‍රී.ලං.ප.සේ. III | මාතලේ | ස.කොමසාරිස් |
| 24 | කේ.සුලෝජනි මිය | ශ්‍රී.ලං.ප.සේ. III | වව්නියාව | ස.කොමසාරිස් |
| 25 | එම්.එල්.එන්. සඳමාලි මිය | ශ්‍රී.ලං.ප.සේ. III | ගම්පහ | ස.කොමසාරිස් |
| 26 | ආර්.එම්.ජී.සී.ඒ.මැණිකේ මෙය | ශ්‍රී.ලං.ප.සේ. III | පුත්තලම | ස.කොමසාරිස් |
| 27 | එන්.ජී.එම්.එස්.කුමාර මයා | ශ්‍රී.ලං.ප.සේ. III | නුවරඑළිය | ස.කොමසාරිස් |
| 28 | ජී.ඩී.ඒ.ස්වර්ණලතා මිය | ශ්‍රී.ලං.ප.සේ. II | කුරුණෑගල | නි.කොමසාරිස් |
| 29 | ඊ.ඩබ්.ඩී.බී.කේ.බී.ඇහැලේපොල මයා | ශ්‍රී.ලං.ප.සේ. III | කුරුණෑගල | ස.කොමසාරිස් |
| 30 | ඩී.එච්.ඩී.ශ්‍යාමලී මිය | ශ්‍රී.ලං.ප.සේ. III | මාතර | ස.කොමසාරිස් |
| 31 | රවි ප්‍රසාද් කළුපහන මයා | ශ්‍රී.ලං.ප.සේ. III | ගාල්ල | ස.කොමසාරිස් |
| **ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය** | | | | |
| 32 | කේ.ඒ.පී.ද සිල්වා මිය | ශ්‍රී.ලං.ග.සේ. I | ප්‍රධාන කාර්යාලය | ප්‍රධාන ගණකාධිකාරි |
| 33 | රේණුකා කොළඹගේ මිය | ශ්‍රී.ලං.ග.සේ. II | ප්‍රධාන කාර්යාලය | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 34 | එම්.පී.කේ.ජයතුංග මිය | ශ්‍රී.ලං.ග.සේ. III | ප්‍ර.කාර්යාලය | ගණකාධිකාරි(ගෙවීම් හා සාරංශ) |
| 35 | ජේ.එච්.දමයන්ති මිය | ශ්‍රී.ලං.ග.සේ. III | ප්‍ර.කාර්යාලය | ගණකාධිකාරි(ප්‍රසම්පාදන හා ගිණුම්) |
| 36 | කේ.ජී.එන්.මධුවන්ති මෙය | ශ්‍රී.ලං.ග.සේ. III | ප්‍ර.කාර්යාලය | ගණකාධිකාරි (වැටුප් හා අත්තිකාරම්) |
| 37 | ඩබ්.ටී.සී.යු.සිල්වා මෙය | ශ්‍රී.ලං.ග.සේ. III | ප්‍ර.කාර්යාලය | ගණකාධිකාරි (ගොවි බැංකු) |
| 38 | කේ.සුරේෂ් කුමාර මයා | ශ්‍රී.ලං.ග.සේ. III | උතුරු පළාත | ගණකාධිකාරි |
| 39 | ඒ.සිත්ති නකීබා මිය | ශ්‍රී.ලං.ග.සේ. III | නැඟෙනහිර පළාත | ගණකාධිකාරි |
| **ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය** | | | | |
| 40 | ටී.එස්.විජේවර්ධන මයා | ශ්‍රී.ලං.ඉ.සේ. I | ප්‍රධාන කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු |
| 41 | ද.දි. ප්‍රභාත් විතාරණ මයා | ශ්‍රී.ලං.ඉ.සේ. III | ප්‍රධාන කාර්යාලය | ඉංජිනේරු(ජල කළමනාකරණ) |
| 42 | කේ.එම්.බී.කැදරගම මයා | ශ්‍රී.ලං.ඉ.සේ. I | මහනුවර | ප්‍රාදේශීය ඉංජිනේරු |

| | | | | |
|---|---|---|---|---|
| 43 | එච්.ජී.කේ.ප්‍රියශාන්ත මයා | ශ්‍රී.ලං.ඉ.සේ. III | හම්බන්තොට | ප්‍රාදේශිය ඉංජිනේරු |
| 44 | අයි.එම්.මුනාස් මයා | ශ්‍රී.ලං.ඉ.සේ. III | අම්පාර | ප්‍රාදේශිය ඉංජිනේරු |
| 45 | රියාසත් අලි මයා | ශ්‍රී.ලං.ඉ.සේ. III | මඩකළපුව | ප්‍රාදේශිය ඉංජිනේරු |

## 1.1.10. දෙපාර්තමේන්තු ගත සහකාර කොමසාරිස්වරුන් පිලිබඳ විස්තර

| අනු අංකය | නිලධාරියාගේ නම | අනුයුක්ත කාර්යාලය |
|---|---|---|
| 01 | ඩබ්ලිව්. සේනාධීර මයා | මාතලේ |
| 02 | එස්.එච්.ආරියපාල මයා | කුරුණෑගල |
| 03 | ඩී.එම්.ටී.බී. දිසානායක මයා | නුවරඑළිය |
| 04. | එස්.පී.පී. සේනාධීර මයා | පුත්තලම |
| 05 | ජී.කේ.එස්. අප්පුහාමි මහතා | කොළඹ |
| 06 | ටී.සී. ප්‍රේමවර්ධන මයා | අම්පාර |
| 07 | එස්.එම්.එම්.එස්. අහමඩ් බාරු මයා | මඩකලපුව |
| 08 | එස්.එම්.පී.කේ. වීරසේකර මැණිකේ මිය | මහනුවර |
| 09 | ඒ.එස්.ඩබ්ලිව් දහනායක මයා | මාතර |
| 10 | එච්.කේ.පී. රංජනී මිය | පොලොන්නරුව |
| 11 | එම්.එම්. එරංග අතපත්තු මයා | ප්‍රධාන කාර්යාලය |
| 12 | කේ.එම්. සිරාජ් මයා | ත්‍රිකුණාමලය |
| 13 | ඩබ්ලිව් ගුණසේන මයා | හම්බන්තොට |
| 14 | ජේ.එම්. තිලකරත්න මයා | ගම්පහ |
| 15 | කේ. මහාදේවරාජා මයා | කිලිනොච්චිය |
| 16 | එස්.වයි.ඩී.ඒ. සෝමවංශ මයා | අනුරාධපුර |
| 17 | ඒ.ආර්.ආර්. රාමනායක මිය | මොනරාගල |
| 18 | ඒ. දේවප්‍රිය මිය | කෑගල්ල |
| 19 | ඩී.එම්.එස්.බී. දිසානායක මයා | බදුල්ල |
| 20 | ඩබ්.ඒ.අයි. පෙරේරා මිය | කුරුණෑගල |

# 1.2 පාලන අංශය.

පාලන අංශය මගින් ඉටු කරනු ලබන ප්‍රධානම සේවාව වනුයේ දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම සාමාන්‍ය ලිපි , ලියාපදිංචි ලිපි හා චෙක්පත් ඒ ඒ අංශ වෙත යොමු කිරීම සහ ඒ ඒ අංශ වලින් ලැබෙන සියලුම ලිපි අදාල ආයතන හා පුද්ගලයින් වෙත යැවීමට කටයුතු කිරීමයි.

ඊට අමතරව පහත සඳහන් සේවාවන්ද පාලන අංශය මගින් ඉටුකරනු ලබයි.

- දෙපාර්තමේන්තුවේ ආරක්ෂක හා පවිත්‍රතා කටයුතු පවත්වාගෙන යෑම.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න හා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- මහජන පෙත්සම් කාරක සභාව හා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අදාල කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු.
- දෙපාර්තමේන්තුවේ සියලුම දුරකථන බිල්පත් , විදුලි බිල්පත්, ජල බිල්පත් පියවීම හා වරිපනම් ගාස්තු ගෙවීම.
- දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සියලුම නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධරාජකාරි.
- දෙපාර්තමේන්තු අභ්‍යන්තර දුරකථන පද්ධතියේ නඩත්තු කටයුතු සිදු කිරීම.
- නිල නිවාස කුලී අය කිරීම.
- දෙපාර්තමේන්තුව වෙත මිල දී ගනු ලබන පුවත්පත් සම්බන්ධ සියලුම රාජකාරි.
- දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් සඳහා දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ලබාදීම.
- දුම්රිය බලපත්‍ර ලබා දීම.
- ප්‍රධාන කාර්යාලීය සෘජු දුරකථන පද්ධතිය නඩත්තු කිරීම.
- ගිනි නිවීමේ උපකරණ නඩත්තු කිරීම.

# 02. සංවර්ධන හා ප්‍රගති පාලන අංශය.

## 2.1 සුළු වරිමාර්ග ප්‍රතිසංස්කරණය.(වැය ශීර්ෂය - 281-2-2-12-2502)

## 2.2 පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන.(වැය ශීර්ෂය - 281-2-2-0-10-2502)

සුළු වරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා රු.මි.2300 ක්ද පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන සඳහා රු.මි.150 ක් ද මහා භාණ්ඩාගාරයෙන් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ලදී. එහිදී වැඩසටහන් දෙක එක් වැඩසටහනක් ලෙස ගෙන රු.මි.2450 ක ප්‍රතිපාදනයක් කර්මාන්තයන් සඳහා යොදවන ලදී. පසුව එහි සංශෝධනයක් සිදු වූ අතර එය රු.මි.1274 ක් ලෙස 2014 වර්ෂය සඳහා යොදා ගන්නා ලදී. ඒ අනුව දිස්ත්‍රික්ක 17 ක් ආවරණය වන පරිදි ව්‍යාපෘති 2614 ක් ඉටු කල අතර වියදම රු.මි.1271.2කි. මූල්‍ය ප්‍රගතිය 99.98% කි.

## 2.3 ගොඩනැගිලි පුනරුත්තාපනය (ගොවිජන සේවා මධ්‍යස්ථාන).
**(වැය ශීර්ෂය - 281-2-2-0-2001)**

2014 වර්ෂයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන පුනරුත්තාපනය සඳහා රු.මි.450 ක් වෙන් කර තිබූ අතර සංශෝධිත ප්‍රතිපාදන මුදල රු.මි.403.5 කි.ඒ අනුව දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි අවිච්ඡේද කර්මාන්ත 04ක් සහ නව කර්මාන්ත 134 ක් ප්‍රතිසංස්කරණය කරන ලදී. එක් ගොවිජන සේවා මධ්‍යස්ථානයකට රු.5,000,000 බැගින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 559 ක සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන ලදී. මේ යටතේ රු.මි.403.34 ක වියදමක් දරා 99.96% ක මූල්‍ය ප්‍රගතියක් දරා ඇත.

## 2.4 ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල අලුත්වැඩියාව.
**(වැය ශීර්ෂය - 281-1-1-0-2001)**

ඉහත වැය ශීර්ෂය යටතේ වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.30 ක් වන අතර වියදම රු.මි.24.5 කි. එහි ප්‍රතිශතය 91.4% ක් වේ. මේ යටතේ දිස්ත්‍රික්ක 16 ක් ආවරණය වන පරිදි අවිච්ඡේද කර්මාන්ත 1 ක් සහ නව කර්මාන්ත 23 ක් අලුත්වැඩියා කරන ලදී.ප්‍රධාන කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු ද මෙම වැය ශීර්ෂය යටතේ සිදු කරන ලදී.

## 2.5 ගොඩනැගිලි ඉදිකිරීම.(වැය ශීර්ෂය - 281-2-2-0-2104)

මේ සඳහා රු.මි.150 ක් වෙන් කර තිබූ අතර සංශෝධිත ප්‍රතිපාදන මුදල රු.මි.77 කි. දිස්ත්‍රික්ක 14 ක් ආවරණය වන පරිදි කර්මාන්ත 19 ක ඉදි කිරීම් කටයුතු සිදු කරන ලදී. ඒ වෙනුවෙන් රු.මි.76.2 ක වියදමක් දරා 99.04%ක මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.

## 2.6 පොහොර ගබඩා ඉදි කිරිම.(වැය ශීර්ෂය - 281-2-2-8-2104)

මෙම වැය ශීර්ෂය යටතේ පොහොර ගබඩා ඉදි කිරිම වෙනුවෙන් රු.මි.50 ක් වෙන් වූ අතර සංශෝධිත ප්‍රතිපාදන මුදල රු.මි.39.8 කි.දිස්ත්‍රික්ක 22 ක් ආවරණය වන පරිදි කර්මාන්ත 24 ක් අවිච්ඡේද කර්මාන්ත 01 ක් වෙනුවෙන් රු.මි. 39.8 වියදමක් දරා ඇති අතර 99.92% ක මූල්‍ය ප්‍රගතියක් දරා ඇත.

## 2.7 ගොවීන්ගේ භාරකාර අරමුදල.

කෘෂිකර්ම අමාත්‍යාංශය වෙතින් ගොවීන්ගේ භාරකාර අරමුදල යටතේ මාතර දිස්ත්‍රික්කයේක සඳහා කෘෂි මාර්ග 36 ක් සඳහා රු.මි.12 ක් වෙන් කල අතර ඉන් කෘෂි මාර්ග 13 ක් වෙනුවෙන් රු.මි.1.8 ක් වියදම් කර ඇත. සුළු වාරිමාර්ග කර්මාන්ත වෙනුවෙන් දිස්ත්‍රික්ක 6 ක කර්මාන්ත 43 ක් සඳහා රු.18.4 ක වියදමක් දරා ඇත. වව්නියා හා මොණරාගල දිස්ත්‍රික්කයන්හි පොහොර ගබඩා 02 ක් වෙනුවෙන් රු.මි.2.5 ක් වියදම් කර ඇත.

## 2.8 ගොවිජන සංවර්ධන අරමුදල.

ගොවිජන සංවර්ධන අරමුදල යටතේ දිස්ත්‍රික්ක 03 ක ව්‍යාපෘති 11 ක් සඳහා රු.මි.61 ක වියදමක් දරා ඇත.

## 2.9 අලුත් සහල් මංගල්‍යය.

ඈත අතීතයේ සිටම ශ්‍රී ලාංකීය ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වූ කෘෂි කර්මාන්තය මුල් කර ගත් වී ගොවිතැනින් ලබා ගන්නා ලද්දාවූ වී අස්වනු වලින් අග්‍ර ඵලය ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේට පූජා කිරීම ගොවි ජනතාව එදා සිටම කර ගෙන ආ උතුම් කාර්යයකි.

මේ උතුම් කාර්යය ‘‘අලුත් සහල් මංගල්‍ය’’ නමින් තවදුරටත් ඔප නංවමින් ජාතික උත්සවයක් ලෙස රජයේ පූර්ණ අනුග්‍රහය ලබමින් වාර්ෂිකව පවත්වාගෙන යාමේ වගකීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ලැබූ මහඟු වරප්‍රසාදයක් බව පවසනුයේ ඉමහත් අභිමානයෙනි. ඒ අනුව අතිගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා හා ලේකම්තුමාගේ උපදෙස් පරිදි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 අප්‍රේල් මස 2 හා 3 දිනයන්හි අලුත් සහල් මංගල්‍යය 47 වන වරටත් ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ වන ශ්‍රී මහා බෝධීන්වහන්සේ අභියසදී උත්සවාකාරයෙන් පවත්වන ලදී.

සතර වාහල්කඩ කිරි ඉතිරවීමේ සිට අලුත් සහල් පෙරහැර ශ්‍රී මහා බෝධීන්වහන්සේ අභියසට පැමිණ පූජා කිරීම දක්වා කටයුතු අභිමානවත් ලෙස ඉටු කරන ලදී. මී පැණි පූජාව හා ගිතෙල් පූජාව ආදිවාසී නායක ඌරුවරිගේ වන්නිල ඇත්තෝ ප්‍රමුඛ ආදිවාසී කණ්ඩායම විසින් පවත්වන ලදී. දිවයිනේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් එක් රැස් කර භාර දුන් සහල් මෙදින පූජා කරන ලද අතර සහල් හා මුදල් ආධාර සැපයීම දිවයින පුරා පිහිටි ගොවි සංවිධාන විසින් කරන ලදී. මෙවර අලුත් සහල් මංගල්‍යය සාර්ථක කර ගැනීමට ආර්ථික සංවර්ධන

අමාත්‍යාංශය,ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, අධිකාරී, මණ්ඩල, උතුරු මැද පලාත් සභාව හා පෞද්ගලික ආයතන ද විශාල දායකත්වයක් ලබා දෙන ලදී. මෙහිදී ''ජාතික අලුත් සහල් මංගල්‍යය'' නමින් සමරු කලාපයක්ද එළි දක්වන ලදී.

## 2.10 දැයට කිරුළ - 2014.

2014 වසර දැයට කිරුළ මංගල්‍ය මෙවර කුරුණෑගල පුත්තලම හා කෑගල්ල යන දිස්ත්‍රික්කයන්හි පැවැත්විණි. මෙම වැඩසටහන සඳහා මෙවර භාණ්ඩාගාරයෙන් රු.මි.4.4 ක ප්‍රතිපාදනයක් වෙන් කරනු ලැබූ අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිර්මාණ කටයුතු වෙනුවෙන් රු.4.32 ක මුදලක් වියදම් කරන ලදී.

## 2.11 යාන්ත්‍රික සේවා සැපයීම.

### 2.11.1 දෙපාර්තමේන්තුව සතු ඩෝසර් හා එක්ස්කැවේටර් යන්ත්‍ර.

සංවර්ධන හා ප්‍රගති පාලන අංශය සම්බන්ධව කටයුතු කරන යාන්ත්‍රික අංශය මේ වන විට යාන්ත්‍රික අධිකාරීවරයෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

දැනට අප දෙපාර්තමේන්තුව සතු ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබා දී ඇති චීන යන්ත්‍ර ප්‍රමාණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | |
|---|---|
| එක්ස්කැවේටර් යන්ත්‍ර | 10 |
| මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර | 01 |
| බැකෝ ලෝඩර් | 08 |
| බුල්ඩෝසර් | 09 |
| පිටුපසින් තල්ලු කරන රෝල් | 04 |
| වයිබ්‍රේටරි රෝල් | 04 |
| වීල් ලෝඩර් | 04 |
| | ----------- |
| | 40 |

ඉහත යන්ත්‍රෝපකරණ වලින් යන්ත්‍ර 08 ක් වෙනත් ආයතන ඉල්ලීම් වලට අනුව එම ආයතන වෙත පවරා දී ඇත.එම ආයතන නම් බස්නාහිර පලාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය, වව්නියාව කොක්එලිය, 56 සේනාංකය, හා කොමාන්ඩෝ රෙජිමේන්තුව, කුඩා ඔය. ඒ අනුව දෙපාර්තමේන්තුව සතු මුළු චීන යන්ත්‍ර ප්‍රමාණය 32 කි.

දෙපාර්තමේන්තුව සතුව පවතින ජපන් ආධාර යටතේ ලබා දුන් ක්‍රියාකාරී පැරණි යන්ත්‍රෝපකරණ ප්‍රමාණය 20 ක් වන අතර, ක්‍රියාකාරී නොවන යන්ත්‍ර ගණන 02 කි. ඒ අනුව

දෙපාර්තමේන්තුව සතු මුළු යන්ත්‍ර ප්‍රමාණය 54 කි. මෙම යන්ත්‍ර ප්‍රමාණය පහත දැක්වෙන පරිදි ප්‍රාදේශීය යාන්ත්‍රික ඒකක වලට අනුයුක්ත කර ඇත.

| *ස්ථානය* | *අලුත් යන්ත්‍ර(චීන)* | *පැරණි යන්ත්‍ර(ජපන්)* | *එකතුව* |
|---|---|---|---|
| 1.මාලඹේ | 01 | 03 | 04 |
| 2.මහව | 07 | 05 | 12 |
| 3.හම්බන්තොට | 05 | 06 | 11 |
| 4.මොණරාගල | - | 07 | 07 |
| 5.අනුරාධපුරය | 19 | 01 | 20 |
| **එකතුව** | **32** | **22** | **54** |

මෙම යන්ත්‍ර වලින් 2014 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවට ලැබී ඇති ආදායම රු.6,678,181.00 කි.

2015 වර්ෂය සඳහා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ පුනරුත්තාපන වැය ශීර්ෂය වන 281-2-2-0-2002 යටතේ රු.මි.20 ක් වන අතර ඉන් රු.මි.10.2 ක් යන්ත්‍රෝපකරණ පුනරුත්තාපනය කිරිම සඳහා වියදම් කර ඇත. යන්ත්‍ර අත්පත් කර ගැනීමේ වැය ශීර්ෂය වන 281-2-2-0-2103 සඳහා රු.මි.20.8 ක් වෙන් වී ඇති අතර රු.මි.20.5 ක් වියදම් කර ඇත.

# 03. ඉංජිනේරු අංශය.

## 3.1 කාර්යය :

- දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන සුළු වාරිමාර්ග, ගොඩනැගිලි, ගොවිජන සේවා මධ්‍යස්ථාන, දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම හා අලුත්වැඩියාවන් පිළිබඳ ඇස්තමේන්තු අනුගත කිරීම ටෙන්ඩර් මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා තාක්ෂණ වාර්තා සකස් කිරීම සහ ටෙන්ඩර් ඇගයීම් කටයුතු සිදුකිරීම.

- බාහිර ආයතන වලින් ඉදිරිපත් කරන පාරිසරික තාක්ෂණ ඇගයීම් පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණ හා අදාල වාර්තා සැපයීම.

- යුධ ගැටුම් වලින් හානි වූ ප්‍රදේශ වල කඩිනම් සංවර්ධන ව්‍යාපෘතිය (CAREP), ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මගින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ කරන ලද සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු හා කෘෂිපාර සංවර්ධන කටයුතු පිළිබඳ වාර්තා **(ඇමුණුම 01.)**හා **(ඇමුණුම 02.)** යටතේ ඉදිරිපත් කර ඇත.

# 04.ආයතනික සංවර්ධන අංශය.

## අරමුණ හා වගකීම:

ගොවි ජනතාවගේ කෘෂිකාර්මික අවශ්‍යතා සපුරාදීම මඟින් ඔවුන්ගේ ආර්ථිකමය හා සමාජයීය පසුබිම ශක්තිමත් කිරීම අරමුණුකොට මැදිහත්කරුවෙකුගේ භූමිකාව ඉටුකිරීම පිණිස සමස්ත ගොවිජන සේවා මධ්‍යස්ථාන ජාලය මෙහෙයවීම සඳහා 2014 වර්ෂය තුළ මෙම අංශය වෙතින් ඉටුකරන ලද කාර්යභාරය ඒ ඒ විෂයයන් ඔස්සේ පහත සඳහන් පරිදි පෙළගස්වනු ලැබේ.

## 4.1ගොවිජන සේවා මධ්‍යස්ථාන අධීක්ෂණය.

### ➢ ගොවිජන සේවා මධ්‍යස්ථාන පරීක්ෂණ වාර්තා ලැබීම.

- ගොවිජනසේවා මධ්‍යස්ථාන අධීක්ෂණයට අදාළව පරීක්ෂණ වාර්තා නියමිත පරිදි ප්‍රධාන කාර්යාලය වෙත එවීමට කටයුතු කරන ලෙස සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් වෙත දන්වා යැවීම. මෙම වර්ෂයේදී ගොවිජන සේවා මධ්‍යස්ථාන පරීක්ෂණ වාර්තා 393 ක් ඉදිරිපත් වී ඇත.

## 4.2 පොදු මුදල්/අක්කර බදු/කුවිතාන්සි පොත් සහ මුදල් පොත් සැපයීම.

ඇණවුම් කර ඇති පොත් ගබඩාවේ තොග අවසන් වන්නට පෙර නැවත මුද්‍රණය කිරීමට කටයුතු කිරීම හා අවශ්‍යතාවය පරිදි දිස්ත්‍රික් කාර්යාල වෙත බෙදා හැරීම.

**කුවිතාන්සි පොත්අලෙවිය - 2014**

| වර්ගය | පොත් ප්‍රමාණය | මුදල |
|---|---|---|
| පොදුමුදල් කුවිතාන්සි පොත් | 23599 | 1,179,950.00 |
| අක්කරබදුකුවිතාන්සි පොත් | 12817 | 640,850.00 |
| කම්ටුමුදල්කුවිතාන්සි පොත් | 115 | 149,500.00 |
| **එකතුව** | **36531** | **1,970,300.00** |

## 4.3 ගොවි සංවිධාන නියෝජිතයින් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.

2014 වර්ෂයේදී සියලු දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර පුහුණු වැඩ සටහන් 15 ක් පැවැත්වූ අතර මේ සඳහා වැය වූ මුදල රු. 345,103/- කි. ගොවිජන සංවර්ධන අරමුදලින් මේ සඳහා ප්‍රතිපාදන ලබා දුනි.

## 4.4 අර්තාපල්, බී ළූණු, වියලි මිරිස් මිලදී ගැනීම.

2014 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ, 2014.08.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පහසුකම් සලසන්නෙකු ලෙස කටයුතු කර ගොවිජන සේවා මධ්‍යස්ථාන වලදී රු.80/- කසහතික මිලක් යටතේ ලක් සතොස මගින් අර්තාපල් මිලදීගැනීමේ කටයුතු ආරම්භ කර අඛණ්ඩව සිදුකෙරිණි. සහතික මිලක් යටතේ ගොවීන්ගෙන් අර්තාපල් මිලදී ගැනීමයටතේ 2014 වර්ෂයේ අර්තාපල් 3,000,506 kg ක් මිළදී ගැනීම සඳහා රු. 240,040,480.00 ක් රජය විසින් වැයකර ඇත.

**රු. 80/- ක සහතික මිලක් යටතේ අර්තාපල් මිලදීගැනීම**

2014 මිලදීගත් සමස්ථ අර්තාපල්ප්‍රමාණය හා මූල්‍ය වටිනාකම

| ස්ථානය | ප්‍රමාණය (Kg) | මුදල (රු.) |
|---|---|---|
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බදුල්ල | 1,144,729 | 91,578,320.00 |
| දිස්ත්‍රික්ලේකම් කාර්යාලය නුවරඑලිය | 1,855,777 | 148,462,160.00 |
| **එකතුව** | **3,000,506** | **240,040,480.00** |

## 4.5කෙතට අරුණ පොහොර සහනාධාර වැඩසටහන.

කෘෂිකර්ම අමාත්‍යංශය මගින් මෙහෙයවනු ලබන සහනාධාර පොහොර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

| කන්නය | පොහොර ලබාගත් ගොවීන් සංඛ්‍යාව | කුඹුරු අක්කර ප්‍රමාණය | නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය (මෙ.ටො.) | | | |
|---|---|---|---|---|---|---|
| | | | යූරියා | T.S.P. | M.O.P. | එකතුව |
| 2013/2014 මහ | 941,792 | 1,423,970.31 | 118,453.03 | 32,188.21 | 36,204.14 | **186,845.38** |
| 2014 යල | 538,048 | 791,350.60 | 58,919.39 | 15,220.42 | 18,378.10 | **92,517.91** |
| 2014/2015 මහ | 534,655 | 847,641.82 | 62,099.44 | 16,102.23 | 19,654.23 | **97,855.90** |

*. 2014/2015 මහ කන්නයට අදාලව මේ වන විට ලැබී ඇති වාර්තා අනුව සකස් කර ඇත.

## 4.6කෙතට අරුණ වගා රක්ෂණ මුදල් රක්ෂණ භාර අරමුදල වෙත යොමුකිරීම.

කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන සහනාධාර පොහොර වැඩසටහන යටතේ ක්‍රියාත්මක කෙතට අරුණ වගා රක්ෂණ ක්‍රමය යටතේ 2013 වර්ෂයේ සිට මේ දක්වා ජාතික රක්ෂණභාර අරමුදල වෙත ප්‍රේෂණය කර ඇති මුදල් පහත පරිදි දැක්විය හැකිය.

| කන්නය | ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් යොමුකල මුදල් ප්‍රමාණය රු. |
|---|---|
| 2013 යල | 275,921,566.00 |
| 2013/2014 මහ | 590,657,542.00 |
| 2014 යල | 53,133,296.00 |
| **එකතුව** | **919,712,404.00** |

2014/2015 මහ කන්නයේ සිට වගා රක්ෂණය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලැබූ බැවින් 2014 යල කන්නය දක්වා ලැබී ඇති වාර්තා අනුව සකස් කර ඇත. මෙහිදී වන්දි ලබාදීම සිදුකරනුයේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගිනි. අප දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් අතරමැදි කාර්යයක් සිදු කරමින් දෙපාර්තමේන්තුවට අයත් ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා රක්ෂණ මණ්ඩලය වෙත ගොවීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සිදුකරයි.

## 4.7ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් සේවා සැපයීම.

ගොවි ජනතාවට අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය , පැළ වර්ග, කෘෂි උපකරණ හා වෙනත් අවශ්‍ය කෘෂිකාර්මික ද්‍රව්‍ය ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් සපයා දීම හා ඒ මගින් ආදායම් ඉපයීමට කටයුතු කර ඇත.

ගොවිජන සේවා මධ්‍යස්ථාන ආදර්ශමත් මධ්‍යස්ථාන ලෙස පවත්වා ගැනීම සඳහා 2 / 2013 චක්‍රලේඛ මගින් දිස්ත්‍රික් නි.කො./ස.කො දැනුවත් කර ඇති අතර ඒ අනුව ගොවිජන සේවා මධ්‍යස්ථානවලආදර්ශමත් ගෙවත්ත සැකසීම, වැට ගේට්ටු සැකසීම හා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ආදර්ශමත්ව පවත්වා ගැනීම සඳහා කටයුතු කර ඇත. කුරුණෑගල දිස්ත්‍රික්කයේ බොරලුවැව නව ගොවිජන සේවා මධ්‍යස්ථානයක් විවෘත කිරීම ද සිදුකරන ලදී.

ගොවිජන බැංකු මගින් ගොවීන්ගේ කෘෂිකාර්මික කටයුතු සඳහා ණය පහසුකම් ලබා දීම හා ඉතිරි කිරීම සඳහා ගොවීන් පෙළඹවීමට කටයුතු කර ඇත.

ගොවි ජනතාවට අවශ්‍ය බීජ හා රෝපන ද්‍රව්‍ය, පැල වර්ග, කෘෂි උපකරන හා වෙනත් අවශ්‍යකෘෂිකාර්මික ද්‍රව්‍ය 2014 වර්ෂය තුළදී දගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා සපයා දී ආදායම් උපයා ඇත. **(ඇමුණුම 03.)**

## 4.8 දිවි නැගුම ජාතික වැඩසටහන 2014

- දිවි නැගුම හයවන අදියර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි 2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරුණු කාර්යයභාරය වනුයේ බීජ හා රෝපන ද්‍රව්‍ය ප්‍රතිලාභීන් වෙත බෙදා හැරීමත් කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පැවති ගෙවතු ආදර්ශ ගෙවතු ලෙස පවත්වා ගැනීම සඳහා ප්‍රතිලාභීන්ට උපදෙස් ලබාදීමත්ය.
- එක් ග්‍රාම නිලධාරී වසමකින් ප්‍රතිලාභින් 180 ක් බැගින් තෝරා ගෙන ග්‍රාම නිලධාරී වසම් 14023 ක් සඳහා එළවලු බීජ කට්ටල ලක්ෂ 25 ක් බෙදා හරින ලදී.

- ග්‍රාම නිලධාරී වසම් 14023 ට අදාළව එක් ග්‍රාම නිලධාරී වසමකින් ප්‍රතිලාභීන් 100 ක් බැගින් තෝරාගෙන එක් ප්‍රතිලාභියෙකුට එළවලු පැල 9 බැගින් ලබා දීමට කටයුතු කරන ලදී. එම එළවළු පැල සිටුවීම සඳහා කොහු බඳුන්, ප්ලාස්ටික් ට්‍රේ සහ බීජ පැළතවාන් කරුවන් වෙත ලබා දී වර්ධනය වූ එළවලු පැළ ප්‍රතිලාභින් වෙත බෙදා දෙන ලදී.

- අලුත් අවුරුද්දට සමගාමීව 2014 වර්ෂයේ අප්‍රේල් මස 05 දින සිට 12 වන දින දක්වා දිවයින පුරා දිවි නැගුම අවුරුදු පොළවල් සංවිධානය කරන ලදී. සමෘද්ධි අධිකාරිය දක්ෂිණ සංවර්ධන අධිකාරිය ඇතුළු ආයතන කිහිපයක සහභාගිත්වයෙන් පැවැත්වූ අතර අවුරුදු පොලවල් 150 ක් පමණ පවත්වන ලදි.

- කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ලබාදුන් කතුරුමුරුංගා පැළ ද , පොල් සංවර්ධන මණ්ඩලය මඟින් ලබාදුන් පොල් පැළ ද අප ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් ප්‍රතිලාභීන් වෙත බෙදා දෙන ලදී.

## 4.9අක්කර බදු.

- ගොවිජන සංවර්ධන අරමුදලට 2014 වර්ෂයේදී අක්කර බදු 20% දායකමුදල්වශයෙන්රු. 16,301,476.00 ක් ලැබී ඇත.

- 2014.03.18 දින සිට 20 දක්වා අක්කර බදු සතියක් පැවැත්වූ අතර එහිදී රු.8,675,896.22ක මුදලක් එකතු කරන ලදී.

## 4.10කාබනික පොහොර ප්‍රචලිත කිරීමේ වැඩසටහන.

- කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලබාදුන් ප්‍රතිපාදන යොදාගෙන 2014 වර්ෂයේ කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන ක්‍රියාකාරකම් දෙකක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී.

- පළමු ක්‍රියාකාරකම - දිවයිනේ ගොවීන් වැඩි පිරිසක් ආවරණය වන පරිදි සෑම දිස්ත්‍රික්කයකම තෝරාගත් ගොවි සංවිධාන නායකයින් හා නිලධාරීන් 7750 ක් මාකඳුර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත යොමු කර කාබනික පොහොර නිෂ්පාදනය, භාවිතය හා ක්‍රමානුකූල රසායනික පොහොර භාවිතය සම්බන්ධයෙන් පුහුණු කිරීම.

- දෙවන ක්‍රියාකාරකම - දිවයිනේ පුරන් කුඹුරු බහුල ප්‍රදේශ සැලකිල්ලට ගනිමින් ගම්පහ,කළුතර, මහනුවර,ගාල්ල, මාතර, පුත්තලම, කුරුණෑගල, බදුල්ල, ත්‍රිකුණාමලය, මඩකලපුව, මන්නාරම, මුලතිව් යන දිස්ත්‍රික්ක වල අක්කර 850ක් ආවරණය වන පරිදි වගාකල හැකි තත්වයේ පවතින නමුත් අතහැර දමා ඇති කුඹුරු කාබනික පොහොර යොදා නැවත වගාකරවීම සඳහා කුඹුරු හිමියන් දිරිගැන්වීම. මෙහිදී කොම්පෝස්ට්, ගොම, කුකුල් පොහොර ආදී වශයෙන් කාබනික පොහොර නියමිත නිර්දේශයකට අනුව කාබනික පොහොර නිෂ්පාදකයින්ගෙන් මිලදී ගෙන අතහැර දමා ඇති කුඹුරු නැවත වගා කරන්නන් වෙත ලබාදීම සිදු කෙරිණි.

## 4.11 2014 වර්ෂය තුළ නව කෘෂියන්ත්‍රෝපකරණ ලැබීම් හා බෙදාහැරීම්.

### 4.11.1 චීන ආධාර යටතේ ලද කෘෂියන්ත්‍රෝපකරණ - 280

මහජන චීන සමූහාණ්ඩුව මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ප්‍රදානය කරන ලද රු. මිලියන 200ක පමණ වටිනාකමින් යුතු පහත සඳහන් කෘෂියන්ත්‍රෝපකරණ 280ක ප්‍රමාණය ,ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි මෙම දෙපාර්තමේන්තුව ඉටුකරන ලදී.

| | කෘෂියන්ත්‍රෝපකරණ වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | රෝද 04 ට්‍රැක්ටර් (SHIFENG වර්ගයේ) | 50 |
| 02. | රොටරි කල්ටිවේටර් | 50 |
| 03. | රෝද 02 ට්‍රැක්ටර් | 100 |
| 04. | තණකොළ කැපීමේ යන්ත්‍ර (ට්‍රැක්ටරයට සවිකරන) | 20 |
| 05. | බීජ වපුරන යන්ත්‍ර (ට්‍රැක්ටරයට සවිකරන) | 20 |
| 06. | පැල සිටුවන යන්ත්‍ර (පදවාගෙන යන) | 10 |
| 07. | පැල සිටුවන යන්ත්‍ර (තල්ලු කරගෙන යන) | 10 |
| 08. | සංයුක්ත අස්වනු නෙලීමේ යන්ත්‍ර -ගොයම් සඳහා වන (FOTON වර්ගයේ) | 10 |
| 09. | සංයුක්ත අස්වනු නෙලීමේ යන්ත්‍ර (ධාන්‍ය සඳහා වන) | 10 |

මෙම යන්ත්‍ර සඳහා දේශීය නියෝජිතයකු නොමැති වීම හේතුවෙන්, ගිවිසුම් ප්‍රකාරව ඒවා එකලස් කිරීමට අදාළ සියලු කටයුතු දෙපාර්තමේන්තුව වෙතින් ඉටුකරගත යුතු වූ අතර, එම

කාර්යය වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතුව සුදුසු භූමි පරිශ්‍රයක් නොතිබූ බැවින්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් පැලවත්ත පිහිටි භූමි පරිශ්‍රය තාවකාලිකව මෙම දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන චීන ජාතික ඉංජිනේරුවරුන් හා මෙම දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර ක්‍රියාකාරුවන්ගේ සහභාගීත්වයෙන් එම කටයුතු ඉටුකරගැනීමට සිදුවිය.

## 4.11.2 2 KR - ජපන් යෙන් ආධාර යටතේ ට්‍රැක්ටර් බෙදාහැරීම හා කළමනාකරණය.

2KR ජපන් යෙන් ආධාර වැඩසටහන යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ලැබී, මෙම දෙපාර්තමේන්තුව මගින් 2012 වර්ෂය දක්වා බෙදාහරින ලද ට්‍රැක්ටර්/කෘෂි උපාංග වෙනුවෙන් 2014 වර්ෂය තුළ දී අයකර දිස්ත්‍රික්කවලින් ප්‍රධාන කාර්යාලය වෙත එවන ලද පහත දැක්වෙන පරිදි අදාළ වාරික මුදල් ප්‍රමාණයන් ගොවිජන සංවර්ධන අරමුදලට බැර කර ඇත.

### 4.11.2.1 රෝද 02 ට්‍රැක්ටර් වාරික මුදල්.

| | |
|---|---|
| 1992-2001 වර්ෂ තුළ ගොවි සංවිධාන වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | -රු. 452,288.34 |
| 2006 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | -රු. 490,865.00 |
| 2008 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | -රු. 3,280,289.00 |
| 2010 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | -රු. 23,371,321.00 |
| 2012 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | -රු. 30,772,975.00 |
| **එකතුව** | -රු. 58,367,738.34 |

### 4.11.2.2 රෝද 04 ට්‍රැක්ටර් වාරික මුදල්.

1989-2001 දක්වා ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබාදී ඇති ට්‍රැක්ටර් සඳහා
-රු. 684,526.32

### 4.11.2.3 වතුරපොම්පවාරිකමුදල්.

2010 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කරන ලද වතුර පොම්ප සඳහා -රු. 951,625.00

2014 වර්ෂයේදී මෙසේ අයකර ගොවිජන සංවර්ධන අරමුදලට බැර කරන ලද වාරික මුදල්වලින් රු. 60,003,889.66ක මුදලක් ජපන් - ශ්‍රී ලංකා ප්‍රතිපාර්ශවීය අරමුදල් වෙත බැර කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු කර ඇත.

### 4.11.2.4 ගර්හිතට්‍රැක්ටර්හාකෘෂිඋපාංගඅපහරණය.

දීපව්‍යාප්තව ගොවිජන සේවා මධ්‍යස්ථානවල අපහරණයට යෝජිතව පවතින ට්‍රැක්ටර්/ට්‍රේලර් 199ක අපහරණ කටයුතු සඳහා ඒවායේ ලියාපදිංචි කිරීමේ සහතිකවල අනුපිටපත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් ලබාගැනීමට කටයුතු කළ අතර, ලියාපදිංචි සහතික ලබාගැනීමට හැකිවූයේ ඒවායින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරිගණකගතව

තිබූ 65ක් සඳහා පමණි. මෙසේ ලබාගත් ලියාපදිංචි සහතික අනුපිටපත්වල සහතික කරන ලද ඡායාස්ථ පිටපත් අදාළ දිස්ත්‍රික්ක වෙත යවන ලදී.

තවද දිස්ත්‍රික්කවල ගර්භිතව පැවති ට්‍රැක්ටර් හා කෘෂි උපාංග ටෙන්ඩර් මගින් / ප්‍රසිද්ධ වෙන්දේසිය මගින් ලද රු. 1,865,988/=ක ආදායමක් හා යුධ හමුදාව වෙතින් භාරගෙන නාරාහේන්පිට ගබඩාවේ තිබූ අබලි ට්‍රැක්ටර් 06ක කොටස් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත අලෙවි කිරීම මගින් ලද රු.27,838/=ක ආදායමක් මෙම වර්ෂය තුළදී ඒකාබද්ධ අරමුදලට බැර කර ඇත.

ඊට අමතරව රත්නපුරය, කෑගල්ල, මහනුවර, මාතලේ හා කුරුණෑගල දිස්ත්‍රික්කවල අපහරණයට යෝජිතව පැවති රෝද 04 ට්‍රැක්ටර් 26ක්, රෝද 02 ට්‍රැක්ටර් 05ක් , රාජ්‍ය මුදල් චක්‍රලේඛ 438 අනුව දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්ගේ නිර්දේශ මත වෘත්තීය පුහුණු ආයතන, කාර්මික විද්‍යාල හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත මෙම වර්ෂයේදී ලබාදී ඇත.

ඒ අනුව රෝද 04 ට්‍රැක්ටර් 32 ක් හා රෝද 02 ට්‍රැක්ටර් 05 ක් 2014 වර්ෂය තුළ අපහරණය කර ඇත.

## 4.12 වාර්ෂික ගිණුම් වාර්තා.

2013 වර්ෂයේ වාර්ෂික ගිණුම් වාර්තා 2014 වර්ෂය තුලදී 410 ක් ලැබී ඇති අතර ඉතිරි හිඟ ගිණුම් වාර්තා සියල්ල ගෙන්වා ගැනීමට දිස්ත්‍රික් මට්ටමින් ලිපි යවා ඇත.

ගිණුම් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළ වාර්ෂික ගිණුම් වාර්තා ලැබීමේ සැලකිය යුතු ප්‍රගතියක් ඇත. **(ඇමුණුම 4)**

# 05.ප්‍රවාහන අංශය.

- 2014 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද සියළුම සංවර්ධන වැඩ (කෘෂි උපකරණ වැඩ, වැව් ප්‍රතිසංස්කරණ කටයුතු, දිවි නැගුම, බීජ ප්‍රවාහනය, ගොවි බැංකු රාජකාරී) හා පනතේ නීතිමය කාර්යයන් සහ පරිපාලනය මඟින් පැවරෙන විවිධ නිල ප්‍රවාහන කටයුතු සඳහා ප්‍රවාහන අංශය මඟින් ඉටු කරන ලදී.

- ප්‍රධාන කාර්යාලය ඇතුළුව සියළුම දිස්ත්‍රික්කයන් හි වාහනවල සියළුම නඩත්තු කටයුතු, අළුත්වැඩියාවන් සඳහා හා ඉන්ධන වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීම, වාහන වල තත්වපාලන වාර්තා ලබා ගැනීම, නිදහස් ආදායම් බලපත්‍ර ලබා ගැනීම, වාහන රක්ෂණය කිරීම, අනතුරු පිළිබඳ පරීක්ෂණ කටයුතු හා පාඩු හානී ලේඛන පවත්වා ගෙන යාම, වර්ෂය අවසානයේ විසර්ජන ගිණුම් පිළියෙල කිරීම, විගණන විමසුම් සඳහා තොරතුරු ඉදිරිපත් කිරීම, දෛනික ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කිරීම, ඉන්ධන ඇනවුම් නිකුත් කිරීම හා ඒ සම්බන්ධ බිල්පත් පියවීම, ඉහළ පරිපාලනයෙන් දන්වා සිටින රාජකාරීමය අවශ්‍යතා වෙනුවෙන් වාහන සැපයීම මෙම අංශය මඟින් ඉටු කරන කාර්යන් මූලික වේ.

- 2014 වර්ෂය වෙනුවෙන් ප්‍රවාහන අංශය මඟින් ඉටුකර ඇති විශේෂ කාර්යයන් සැකවින් පහත දැක්වේ.

    1. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් පැවරූ ප්‍රවාහන රාජකාරී.
        - චීන රජයෙන් ආධාර වශයෙන් ලබා දී තිබූ කෘෂි උපකරණ (රෝද 02 ට්‍රැක්ටර්,රෝද 04 ට්‍රැක්ටර්,ගොයම් කපන මැෂින් පැළ සිටුවීමේ යන්ත්‍ර) දිවයින පුරා ප්‍රවාහනය
    2. වැව් ප්‍රතිසංස්කරණය සඳහා බුල්ඩෝසර් සහ එස්කැවේටර් යන්ත්‍ර,ප්‍රයිම්මුවර් හා ලොරි රථ මඟින් දිවයින පුරා ප්‍රවාහනය.
    3. කාබනික පොහොර නිෂ්පාදන ඒකක වෙත කෘෂි උපකරණ කට්ටල ලොරිරථ මඟින් ප්‍රවාහනය කිරීම.
    4. අළුත් සහල් මංගල්‍යය, දැයට කිරුළ වප් මඟුල්,ගොවි බැංකු වැඩසටහන් සඳහා ලොරි රථ හා සැහැල්ලු වාහන සැපයීම.
    5. ගර්හිත වාහන ප්‍රසම්පාදනය මඟින් විකුණා රජයේ ආදායමට බැර කිරීම.
    6. නිළධාරී ප්‍රවාහන කටයුතු කොළඹ දිස්ත්‍රික්කය ඇතුළත සහ දිවයින පුරා සැහැල්ලු වාහන යෙදවීම

- රාජකාරීසඳහාප්‍රවාහනසංචිතයමඟින්වාහනවෙන්කිරීමේදීමහත්අපහසුතාවයකටපත්වීමටසිදු වේ. මන්ද යත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සංචිතයට යොදවා ඇති වාහන රාශියක් ආයු කාලය අවු.20 ඉකුත් වී තිබීම හේතුවෙන් සෑම විටම අළුත්වැඩියාවන් සඳහා යොදවා තිබීම, සංචිතයට අවශ්‍ය වාහන නොතිබීමට හේතුවේ.

# 06.නීති අංශය.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් වලින් ප්‍රශස්ත ඵලදායිතාවක් ලබා ගනිමින් ශ්‍රී ලාංකීය ගොවි ජනතාව තිරසාර සංවර්ධනයක් සඳහා රැගෙන යාමේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දර්ශණය මුදුන්පත් කරලීම සඳහා පහත සඳහන් ආකාරයෙන් නීති අංශය එම මෙහෙවරට දායක වේ.

1. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සැකසීමට ගොවිජන නීතිය, ඊට අදාල රිති සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු අමාත්‍යාංශය වෙත ලබා දීම හා සහාය වීම.
2. අඳ ගොවීන් හා ඉඩම් හිමියන් අතර ඇති වන කෘෂිකාර්මික ආරවුල් විසඳීම සඳහා වන නෛතික මගපෙන්වීම.
3. වගා අයිතිවාසිකම් ආරක්ෂා කර දීම.
4. ග්‍රාමීය වාරි කර්මාන්ත ආරක්ෂා කිරීම හා වගා රීති ක්‍රියාත්මක කිරීමට අදාල නීතිමය රැකවරණය සැලසීම.
5. දෙපාර්තමේන්තු නිලධාරින් හා ගොවීන් ආයතන සඳහා නීතිමය උපදේශනය
6. ගොවිජන නීතියබලගැන්වීම සඳහා අධිකරණමය කාර්යයන්හි නිරත වීම.

## 6.1 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත.

2000 අංක 46 දරණ පනතට 2011 අංක 46 දරණ සංශෝධිත පනත ගෙන ආ අතර එය 2011.11.22 දින සිට ක්‍රියාත්මක වන බැවින් ඒ අනුව අඳ ගොවි අනුප්‍රාප්තිය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. එමඟින් 2000.08.18 දින හෝ ඊට පෙර දිනවල ලිඛිත හෝ වාචික ගිවිසුමක් මත අඳ ගොවි අයිතිවාසිකම් හිමි අයකු මිය ගිය අවස්ථාවකදී අඳ අයිතිය උරුම විය යුතු බව සහ අඳ ගොවියා පූර්ණ දුබලතාවයකට පත් වූ විට අඳ ගොවි අනුප්‍රාප්තිය පැවරීම සඳහාද ප්‍රතිපාදන සලසා ඇත.

දැනට ක්‍රියාත්මක වන 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හා 2011 අංක 46 දරණ(සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නියෝග සාදා මේ වනවිට ක්‍රියාත්මක වන අතර කාලීනව ඉතාමත් වැදගත් වන කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂමව වගා කිරීම සඳහා වන පනතේ 22,23,25 සහ 26 වගන්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නියෝග සාදා දැනටමත් වගා නොකර පුරන්ව පැවති කුඹුරු ඉඩම් විශාල ප්‍රමාණයක් වගා කෙරෙමින් පවතී. එසේම ගොවිජන සංවර්ධන පනතේ ඉතිරි නියෝග සාදා මේ වනවිට නීති කෙටුම්පත් සම්පාදක වෙත යැවීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

## 6.2ගොවි ආරවුල් විසඳීම. (ගොවිජන විනිශ්චය සභා)

ඉඩම් හිමියන් විසින් අඳ ගොවීන් නෙරපීම, අඳ ගොවීන් විසින් ඉඩම් හිමියන් වෙත ප්‍රවේනි ගෙවීම පැහැර හැරීම ඇතුළු ගොවිජන සංවර්ධන පනත යටතේ සඳහන් වගන්ති 10 ක් පමණ ගොවිජන විනිශ්චය සභාව මගින් පරීක්ෂන පැවැත්විය යුතු ලෙස දක්වා ඇති අතර 2011 අංක 46 දරණ (සංශෝධිත) ගොවිජන සංවර්ධන පනතට අනුව ගොවිජන විනිශ්චය සභා වල තීරණයට එරෙහිව අභියාචනා කිරීම සඳහා පිහිටුවා ඇති සමාලෝචන මණ්ඩල ක්‍රියාත්මක

කිරීම සඳහා අවශ්‍ය නියෝග ගැසට් කර ඇති අතර ගොවිජන විනිශ්චය සභා පිහිටුවා ක්‍රියාත්මක වන අතර සමාලෝචන මණ්ඩල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

ගොවිජන විනිශ්චය සභා පිහිටුවීම ප්‍රමාදවීම හේතුවෙන් ගොවිජන විනිශ්චය සභාව වෙත යොමුකිරීමට තබා ඇති ඉල්ලීම් සංඛ්‍යාව 2014 වර්ෂය දක්වා පහත සඳහන් ආකාරයෙන් වර්ධනය වී ඇත.

| වර්ෂය | ඉල්ලීම් සංඛ්‍යාව |
|---|---|
| 2004 | 660 |
| 2005 | 1151 |
| 2006 | 2327 |
| 2007 | 3422 |
| 2008 | 3510 |
| 2009 | 3945 |
| 2010 | 4285 |
| 2011 | 4583 |
| 2012 | 4915 |
| 2013 | 5342 |
| 2014 | 6972 |

## 6.3ගොවි පැමිණිලි (පොදු)

ගොවිජන සංවර්ධන පනත යටතේ ලැබී ඇති පැමිණිලි.

| 2014 වර්ෂය තුල ලැබීම් | 2014.01.01දිනට ඉතිරි | 2011වර්ෂය තුල විසඳීම් | 2013.12.31දිනට ඉතිරි |
|---|---|---|---|
| 9599 | 2839 | 6540 | 5898 |

## 6.4 අධිකරණ කටයුතු වලට මැදිහත්වීම.

නීතිපති සහාය ලබා ගැනීමට කටයුතු කිරීම.

ශ්‍රේෂ්ඨාධිකරණය - **05**
අභියාචනාධිකරණය - **10**
දිසා අධිකරණය - **08**
මහාධිකරණය - **26**
මහේස්ත්‍රාත් අධිකරණය - **23**

කුඹුරු ඉඩම් අනවසරයෙන් ගොඩ කිරීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමෙන් නීතිමය පියවර ගැනීම2014වර්ෂය තුල ප්‍රගතිය පහත දැක් වේ.

1. අනවසර ගොඩ කිරීම් /ඉදි කිරීම් සඳහා තහනම් නියෝග ලබා ගත් සංඛ්‍යාව
(33 වගන්තිය) - **163**
2. වරදටදඬුවම්කිරිමහායථාතත්ත්වයටපත්කිරීම - (32 වගන්තිය) – **144**

## 6.5. කෘෂිකාර්මික ඉඩම් ලේඛණ සම්බන්ධ කාර්යයන්.

ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක කිරිමේදී උක්ත පනතේ 53 වගන්තිය කෘෂිකාර්මික ඉඩම්ලේඛණ සම්බන්ධයෙන් පනවා ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ එම කටයුතු අධීක්ෂණය කිරීම වැදගත් කාර්යයකි.දිවයිනේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ඇති කෘෂිකර්ම ඉඩම් ලේඛණ (ගොඩ/මඩ) මහජන පරීක්ෂාව සඳහා සෑම වර්ෂයකටම දෙවරක් එනම් ජනවාරි හා ජූලි මාසවල විවෘතව තබන බව පුවත්පත් මගින් දැනුම් දෙනු ලැබේ. එසේ විවෘතව තැබීමෙන් අනතුරුව ඒ පිළිබඳව ලැබෙන ඉල්ලුම්පත් පරීක්ෂා කර බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ගොවිජන සේවා කාරක සභාවල වගකීමකි. උක්ත ක්‍රියාවලියේ ප්‍රගතිය පහත ඉදිරිපත් කර ඇත.

**කෘෂිකාර්මික ඉඩම් ලේඛණ සංශෝධනය.**

| 2014 වර්ෂය තුල ලැබීම් | පෙර වර්ෂ වල ඉතිරි | පරීක්ෂණ කළයුතු මුලු ගණන | පරීක්ෂා කර අවසන් | ඉතිරි සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 9442 | 13364 | 22806 | 6436 | 16370 |

## 6.6නෛතික උපදේශන කාර්යයන්.

දෙපාර්තමේන්තු නිලධාරින් වගඋත්තරකරුවන් කරමින් අධිකරණයේ පවරනු ලබන නඩු සම්බන්ධයෙන් නීතිපති සහාය ලබා දීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී අධිකරණයේ පෙනී සිටීම සිදු කරනු ලැබේ. යම් යම් හේතූන් මත මානව හිමිකම් කොමිෂම මගින් සහනයක් අපේක්ෂා කරන්නන් සඳහා අවශ්‍ය සහාය ලබාදීම සහ පෙනී සිටීම සිදු කෙරේ.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වරයා වෙත, මානව හිමිකම් කොමිෂම වෙත අවශ්‍ය අවස්ථාවන්හිදී පෙනී සිටිමින් කරුණු ඉදිරිපත් කිරිම සිදු කරනු ලැබේ. එහි විස්තර පහත දැක් වේ.

| | |
|---|---|
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් වූ පැමිණිලි (2014) | 06 |
| මානව හිමිකම් කොමිෂමට ඉදිරිපත් වූ පැමිණිලි (2014) | 01 |
| පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට පිලිතුරු සැපයීම (2014) | 08 |
| පාර්ලිමේන්තු වාචික ප්‍රශ්ණ සඳහා ඉදිරිපත් වූ පැමිණිලි (2014) | 06 |
| අල්ලස් හෝ දූෂණ විමශණ කොමිෂන් සභාව (2014) | 03 |
| සිවිල් නඩු විධාන සංග්‍රහය (461 වගන්තිය) (2014) | 07 |
| නීතිපති උපදෙස් ලබාගැනීම | 01 |

# 07.ගිණුම් අංශය.

2014 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුව වෙත මහාභාණ්ඩාගාරයේ අනුමත සමස්ථ ප්‍රතිපාදන ප්‍රමාණය රු:මි: 6,474.74 කි. ඒ මෙම දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් වැඩ සටහන හා සංවර්ධන වැඩසටහන යන වැඩ සටහන් දෙක වෙනුවෙනි. මින් මෙහෙයුම් වැඩසටහන යටතේ සාමාන්‍ය පරිපාලනය නම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර, සංවර්ධන වැටසටහන යටතේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය පවතී.

2014 වර්ෂය සඳහා වෙන් වූ සමස්ත ඇස්තමේන්තුවෙන් රු:මි:4,434.74 ක් පුනරාවර්තන වැය සඳහා වන අතර, රු:මි: 2,040.0 ක් මූලධන ව්‍යාපෘති සඳහා වේ. එම පුනරාවර්ථන හා මූලධන ප්‍රතිපාදන ඉහත වැඩසටහන් විෂයේ වර්ෂය තුල උපයෝජනය වූ ආකාරය පහත පරිදි වේ.

| විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය රු:මි: | වාර්ෂික වියදම රු:මි: | ප්‍රතිපාදන ඉතිරිය රු:මි: | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| පුනරාවර්තන | | | | |
| 1 මෙහෙයුම් | | | | |
| පුද්ගල පඩිනඩි | 233.71 | 233.7 | 0.001 | 99% |
| වෙනත් | 58.13 | 56.42 | 1.72 | 97% |
| | | | | |
| 2 සංවර්ධන | | | | |
| පුද්ගල පඩිනඩි | 3,958.25 | 3,958.12 | 0.13 | 100% |
| වෙනත් | 184.65 | 181.83 | 2.82 | 98% |
| | | | | |
| මූලධන | | | | |
| 1 මෙහෙයුම් | | | | |
| ගොඩනැගිලි පුනරුත්තාපන | 30.0 | 24.5 | 5.5 | 81.8% |
| වාහන පුනරුත්තාපන | 15.0 | 5.7 | 9.3 | 38.3% |
| ගෘහභාණ්ඩ හා උපකරණ | 7.0 | 6.9 | 0.1 | 98.6% |
| පුහුණු හා හැකියා වර්ධන | 3.0 | 2.9 | 0.1 | 100% |
| | | | | |
| 2 සංවර්ධන | | | | |
| | | | | |
| ගොඩනැගිලි පුනරුත්තාපන | 403.5 | 403.3 | 0.2 | 99% |
| යන්ත්‍ර පුනරුත්තාපන | 20.0 | 10.3 | 9.7 | 51% |
| වාහන පුනරුත්තාපන | 14.0 | 7.6 | 6.4 | 54% |
| | | | | |
| ගෘහභාණ්ඩ හා උපකරණ | 131.5 | 131.48 | 0.02 | 99% |
| යන්ත්‍ර අත්පත් කර ගැනීම් | 20.8 | 20.6 | 0.2 | 98% |
| ගොඩනැගිලි ඉදිකිරීම් | 77.0 | 76.3 | 0.7 | 99% |
| | | | | |
| පොහොර ගබඩා ඉදිකිරීම් | 39.8 | 39.7 | 0.03 | 99% |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| පුරන් කුඹුරු අස්වැද්දීම | 3.0 | 2.9 | 0.01 | 99% |
| | | | | |
| දැයට කිරුළ | 4.4 | 4.3 | 0.01 | 98% |
| | | | | |
| සුළුවාරිමාර්ග පුනරුත්තාපනය | 1,271.0 | 1,270.9 | 0.1 | 99% |
| | | | | |
| | | | | |

මෙතෙක් මෙම දෙපාර්තමේන්තුව වෙත ඉතිහාසයේ ලද ඉහළම මූලධන ප්‍රතිපාදන ප්‍රමාණය 2014 වර්ෂයේ දී ලද අතර, එම ප්‍රතිපාදන දිවයිනේ දිස්ත්‍රික් කාර්යාල 25ම දායක කරගනිමින් රටේ සංවර්ධන කාර්යය සඳහා උපයෝජනය කල අතර, එහි සෑම අංශයකම ප්‍රතිපලය සියයට 95 ඉක්මවන ලදි. ගිණුම් අංශයේ කාර්ය මණ්ඩලය මනාව මෙහෙයවමින් අදාල ප්‍රතිපාදන බෙදා හැරීමත්, මූල්‍ය කළමණාකරණය සාර්ථකව ඉටු කිරීමත් පසුගිය වසරේ අප ලද ජයග්‍රහණයවේ.

- දෙපාර්තමේන්තුවෙහි රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේහි (281011/281012) විස්තර ඇමුණුම 04 න් දැක්වේ.
- 2014 වර්ෂය තුලදී උත්සව අත්තිකාරම් ලෙස රු.මි. 52.3ක්ද, විශේෂ අත්තිකාරම් ලෙස රු.මි. 9.5 ක්ද , ආපදා ණය ලෙස රු.මි. 128.3ක්ද නිලධාරීන් වෙත නිකුත් කර ඇත.

# 08. අභ්‍යන්තර විගණන අංශය.

මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයයට අනුයක්තව ප්‍රධාන අභ්‍යන්තර විගණක හා නිලධාරින් 32 දෙනෙකු 2014 වර්ෂයේ සේවයේ යෙදි ඇත. දිස්ත්‍රික්ක 19 ක් ආවරණය වන පරිදි 2014 වර්ෂයේ දි අභ්‍යන්තර විගණන 105 ක් සිදුකර ඇත. එයට අමතරව ප්‍රධාන කාර්යාලයිය අංශවල විගණන 03 ක් සහ එක් ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයක් විගණනය කර ඇති අතර, විස්තර පහත පරිදි වේ.

| **අභ්‍යන්තර විගණන පරික්ෂණ සම්බන්ධ විස්තර** | |
|---|---|
| මහනුවර | 03 |
| අනුරාධපුරය | 13 |
| හම්බන්තොට | 05 |
| ගම්පහ | 08 |
| ගාල්ල | 06 |
| මොනරාගල | 06 |
| කළුතර | 05 |
| මාතලේ | 04 |
| රත්නපුර | 06 |
| කෑගල්ල | 03 |
| කොළඹ | 02 |
| කුරුණෑගල | 11 |
| බදුල්ල | 09 |
| මාතර | 05 |
| නුවරඑලිය | 06 |
| පොලොන්නරුව | 06 |
| අම්පාර | 05 |
| ත්‍රිකුණාමලය | 02 |
| **එකතුව** | **105** |
| ප්‍රධාන කාර්යාලයේ පරික්ෂණ | 03 |
| දිස්ත්‍රික් කාර්යාල | 01 |
| **මුළු එකතුව** | **109** |

ගොවිජන සේවා මධ්‍යස්ථානයන් හී ගෙවීම් කටයුතු පිළිබඳ පරීක්ෂණයන් 40 ක්, දිස්ත්‍රික් කාර්යාලයන්හී ගණුදෙනු පිළිබඳ පරීක්ෂණයන් 01 ක්, ගොවිජන සේවා මධ්‍යස්ථානයන් හී සහනාධාර පොහොර ගණුදෙනු පිළිබඳ පරීක්ෂණයන් 05 ක්, ගොවි බැංකු ගණුදෙනු පිළිබඳ පරීක්ෂණයන් 59 ක් හා ගොවිජන සංවර්ධන අරමුදලේ ගෙවීම් හා ලැබීම් පිළිබඳ විගණන පරීක්ෂණයන් 03 ක් ලෙස මෙම විගණනයන් මෙහෙයවා ඇත.

- **ඉහත දක්වා ඇති විගණන පරික්ෂණයන්ට අමතරව පහත කටයුතු ද සිදුකර ඇත.**

    1. සියළුමදිස්ත්‍රික්කවලබැංකුසැසඳුම්පරික්ෂාකරනිවැරදිකිරිමටඋපදෙස්දිම.
    2. කුරුණෑගල,නුවරඑළිය,ගාල්ල,කොළඹයනදිස්ත්‍රික්කවලඅවසන්ගිණුම්පරික්ෂාකරනි වැරදිකිරිමටඋපදෙස්දිම.
    3. බදුල්ලමඩකළපුව,අම්පාර (දෙමලමාධ්‍ය)දිස්ත්‍රික්කවලමධ්‍යස්ථානඅවසන්ගිණුම්සකස්කිරිමපිළිබඳපුහුණුකටයුතු සිදුකිරිම.

# 09.එළදා වර්ධන හා අලෙවි අංශය.

"ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ සහ සියලු කෘෂිකාර්මික ඉඩම්වල තිරසාර සංවර්ධනය" යන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම සාක්ෂාත් කරගනු පිණිස එළදා වර්ධන හා අලෙවි අංශය වෙත පැවරී ඇත්තේ සුවිශේෂී කාර්ය භාරයකි.ඒ **"කාර්යක්ෂම ඉඩම් වගාව"** යන විෂය ඔස්සේ ය.වසර ගණනාවක් පුරා කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන්ට යෙදවීම හා කුඹුරු ඉඩමක් නොවන බවට සහතිකයක් නිකුත් කිරීම යන කාර්යයන්ට මෙම අංශයේ ප්‍රමුඛත්වය ලබා දී තිබීම නිසා මෙම සුවිශේෂී විෂය මෙතෙක් යටපත්වී පැවතිය ද එළදා වර්ධන හා අලෙවි අංශයෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවටත්,ඒ ඔස්සේ රටටත් ඉටුවිය යුතු මෙම උත්කෘෂ්ඨ කාර්යභාරය නිවැරදිව හඳුනා ගැනීම හා ඒ ඔස්සේ ඉදිරි ගමනකට පලමු පියවර තැබීමටත් 2014 වර්ෂයේදී කටයුතු කරනු ලැබීය.

## 9.1 පුරන් කුඹුරු අවම කිරීමේ වර්ෂය 2015.

ශ්‍රී ලංකාව තුළවිශේෂයෙන් පහතරට තෙත් කලාපය තුළ ඇති පුරන් කුඹුරු යලි වගා කරවීම ඉලක්ක කරගනිමින් 2015 යල කන්නයේ සිට ඉදිරියට ක්‍රියාත්මක වන නව වැඩපිළිවෙළක් සකස් කිරීම එළදා වර්ධන අලෙවි අංශය මඟින් සිදු කරන ලද ප්‍රධානතම කටයුත්තකි. කාර්යක්ෂම ඉඩම් වගාව ඉලක්ක කරගත් 4/2009 චක්‍රලේඛය ක්‍රියාත්මක කිරිමේ පසුබෑස්මක් ඇති බව නිරීක්ෂණය වී තිබුණෙන්,එකී චක්‍රලේඛය අනුව කටයුතු කිරීමට මෙම වැඩසටහන යටතේ කටයුතු සලස්වා ඇත.

## 9.24/2009 චක්‍රලේඛය සංශෝධනය කිරීම.

කාර්යක්ෂම ඉඩම් වගාවට අදාලව 4/2009 චක්‍රලේඛයට අනුව කටයුතු කිරිමේ පසුබෑමක් ඇති වීමට හේතු විමසා බැලීම පිණිස මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරිමේදී මුහුණපාන ගැටළු හා ප්‍රායෝගික දුෂ්කරතාවයන් මොනවාද යන්නත් ඒවා අවම කර ගැනීම සඳහා සුදුසු යෝජනාත් සියලු දිස්ත්‍රික්භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් වෙතින් විමසන ලදී.එසේම ක්ෂේත්‍ර පරීක්ෂණවල යෙදෙමින් 4/2009 චක්‍රලේඛය ක්‍රියාත්මක කිරිමෙහි නිරතවූ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිළධාරීන් ප්‍රායෝගිකව මුහුණ දුන් ගැටළු පිළිබඳව ද ඒවා අවම කිරීමට ගත් ක්‍රියා මාර්ග පිළිබඳව ද විමසීම් කරනු ලැබීය.මේ සඳහා ලද පිළිතුරු ද අදාල නෛතික තත්වයන් ද විශ්ලේෂණය කොට 4/2009 චක්‍රලේඛය සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර 4/2009 චක්‍රලේඛයේ පැවති ගැටළු හා ප්‍රායෝගික තත්වයන් හැකිතාක් අවම කර ගනිමින් එකී චක්‍රලේඛය සංශෝධනය කිරීමේ කටයුතු ආරම්භ කරනු ලැබීණ.

## 9.3 "ගොවිජන සංදේශය" ගුවන් විදුලි වැඩසටහන.

කාර්යක්ෂම ඉඩම් වගාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා පෙළඹවීම සඳහා මෙම වැඩසටහන නිර්මාණය කරනු ලැබිණ.එසේම කුඹුරු ඉඩම් වල අනවසර ක්‍රියා සිදු කිරීම වැළැක්වීමටත් වෙනත් කාර්යයන්ට යෙදවීමට ඉල්ලුම් කිරීම අධෛර්යමත් කිරීමත් මෙම වැඩසටහන මඟින් අරමුණු කෙරිණි.දේශීය වී වගාව ප්‍රචලිත කිරීම, පරිසර හිතකාමී කාබනික පොහොර භාවිතයේ වැදගත්කම හඳුන්වා දීම, කිසිසේත්ම වගා කල නොහැකි වුවද කුඹුරු ඉඩමක් පරිසර පද්ධතියක් ලෙස වැදගත්වන ආකාරය පෙන්වා දීම වී වගාකල නොහැකි ඉඩම් වල 14/2012 හා 15/2012 චක්‍රලේඛ අනුව කටයුතු කල හැකි බව දැනුවත් කිරීම,කුඹුරු ඉඩමක ඉදිකිරීම් කිරීමේ අසාර්ථක ප්‍රතිපල යනාදී වැදගත් කරුණු රැසක් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලද අතර නිසි කලට වේලාවට වගා නොකරන අවස්ථාවල හා අනවසර කටයුතු කුඹුරු ඉඩම් වල සිදුකරන අවස්ථාවලට අදාල නෛතික තත්වයද මේ ඔස්සේ පැහැදිලි කිරීමට කටයුතු යොදන ලදී.

## 9.4 සාම්ප්‍රදායික දේශීය වී වගාව හා කාබනික පොහොර භාවිතය.

ඖෂධීය හා පෝෂණීය ගුණාංගයන්ගෙන් යුත් වස විසෙන් තොර පරිසර හිතකාමී සාම්ප්‍රදායික වී වගාවේ සාර්ථකත්වය අධ්‍යනය කිරීමට 2014 වර්ෂයේ කටයුතු කරන ලද අතර එළදා වර්ධන හා අලෙවි අංශයට අදාල සම්බන්ධීකරන දිස්ත්‍රික්කය වන කෑගල්ල දිස්ත්‍රික්කය මූලික වශයෙන් මෙම අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබිණි.දේශීය වී වගාව පිළිබඳ මනා උනන්දුවක් ඇති ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිළධාරීන් වරුන් මෙන්ම ගොවි සංවිධාන , ගොවීන් හා වෙනත් සංවිධාන සමඟ ද සම්බන්ධ වෙමින් මෙම අධ්‍යයනය සිදුකරන ලද අතර දේශීය වී වගාව පිළිබඳ සාධනීය ලක්ෂණ ගනණාවක් හා එහි සාර්ථකත්වය පිළිබඳ තොරතුරු මෙමගින් එක්රැස් කෙරිණි..2015 වර්ෂයේදි දේශීය වී වගාව පිළිබඳ ජාතික මට්ටමේ වැඩසටහනක් සැකසීමට අවශ්‍ය මූලික දැනුම මෙමඟින් ලබා ගන්නා ලදී.

## 9.5 කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන්ට යෙදවීම හා කුඹුරු ඉඩමක් නොවන බවට සහතික නිකුත් කිරීම සීමා කිරීම.

ඉහත කරුණු වලට අදාල නව ඉල්ලීම් ඉදිරිපත් වීමේ ප්‍රවණතාවය ඉතා වේගයෙන් ඉහළ යන බව පෙනීගිය අතර ඒ පිළිබඳ ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම එයට හේතුව බව නිරීක්ෂණය විය.මෙය කාර්යක්ෂම ඉඩම් වගාව හා එළදා වර්ධන හා අලෙවි අංශයේ විෂය පථය සමඟ අනුකූල නොවන මෙන්ම එම අරමුණ කරා යන ගමනට බාධාකාරී වන කටයුත්තක් බව හඳුනාගන්නා ලද අතර එය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි දැක්ම හා නොගැලපෙන කටයුත්තක් බවට නිරීක්ෂණය විය.ඒ අනුව කුඹුරු ඉඩම් නාම ලේඛණ ප්‍රතිශෝදන කටයුතු අවසාන වන තෙක් ඉහත කටයුතු සඳහා නව ඉල්ලීම් භාර ගැනිම, 2014.08.01 දිනට දිස්ත්‍රික් මට්ටමින් සම්පූර්ණ කරන ලද වාර්තා සහ සුවිශේෂී ව්‍යතිරේඛ අවස්ථා කිහිපයක් හැර සෙසු වාර්තා පිළිබඳ කටයුතු කිරීම අත්හිටුවන ලදී. ශ්‍රී ලංකාවේ පවත්නා කුඹුරු ඉඩම් ආරක්ෂාකර ගැනිම සහ කාර්යක්ෂම ඉඩම් වගාව සඳහා ජනතාව පෙළඹවිම මෙහි අරමුණ වේ

# 10. ගොවිජනබැංකු (නියමු) ව්‍යාපෘතිය.

### ගොවිජන බැංකුවේ දැක්ම.

*"ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසාර සංවර්ධනය සහතික කෙරෙන මූල්‍ය සංස්කෘතියක්"*

### ගොවිජන බැංකුවේ මෙහෙවර.

*"ස්වශක්තියෙන් හෙබි අභිමානවත් ගොවිජන සමාජයක් ගොඩනැගීමට අවශ්‍ය කෙරෙන මූල්‍ය ශක්තිය එම සමාජය තුළ ස්ථාපිත කිරිම සඳහා ගොවි ජනතාව සංවිධානය කිරිම, සවිබල ගැන්වීම, ආයතනික ව්‍යුහයන් සංවර්ධනය කිරිම සහ පහසුකම් සැලසීම."*

## 10.1 ගොවිජන බැංකුවේ අභිමතාර්ථ.

1. ග්‍රාමීය ජනතාවගේ දිළිඳුකම තුරන් කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය මූල ධනය සපයා ගැනීමට සහාය වන ආයතනයක් ලෙස කටයුතු කිරීම.
2. ගොවි ජනතාවගේ ඉතිරි කිරීම් නැමියාව වර්ධනය කර ගැනීම හා ඒ තුළින් ඔවුන්ගේ ආයෝජන ශක්තිය වර්ධනය කිරීමට සහාය විම.
3. යැපුම් මට්මමේ කෘෂිකර්මාන්තය වාණිජමය මට්ටමකට පත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සහ උපදේශාත්මක පහසුකම් සලසා දීම.
4. ගොවි ජනතාව සංවිධාන ගතකර ඔවුන්ගේ මූල්‍ය හා ආර්ථික ශක්තිය වර්ධනය කර ගැනීමට අවකාශ සැලසීම.
5. ගොවි ජනතාව සමාජීය වශයෙන් බලවත් සමාජ ස්ථරයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය කෙරෙන මූල්‍ය පරිසරය ගොඩනැගීම සහ ඔවුන්ගේ සුභසාධන කටයුතු සඳහා දායක විම.
6. ගොවි ජනතාව සතු මුදල් සහ ප්‍රාග්ධනය එම ජනතාව අතරම සංසරණය වීමට අවකාශ සැලසීම මඟින් ගොවි ආර්ථිකය ප්‍රසාරණය කිරිම.
7. ගොවි සංවිධාන ශක්තිමත්කර කෘෂි කර්මාන්තය පාදක කර ගත් ව්‍යාපාර සඳහා ඔවුන්ට අවශ්‍ය මූල්‍ය ශක්තිය ලබා දිම.
8. ලොකු ළූණු, මුං, සෝයා ආදී දැනට විශාල වශයෙන් ආනයනය කරන බෝග වගාවන් සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයිම තුළින් එම වගාවන් බහුල කිරීම හා එමගින් ජාතික ආර්ථිකයට ශක්තියක් සැපයීම.

## 10.2 2014.12.31 දිනට දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවා ඇති ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘති සංඛ්‍යාව.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ගොවිජන සේවා මධ්‍යස්ථාන ගණන | පිහිටුවා ඇති ගොවිජන බැංකු ගණන |
|---|---|---|---|
| 01 | කොළඹ | 9 | **8** |
| 02 | ගම්පහ | 26 | **26** |
| 03 | කළුතර | 20 | **19** |
| 04 | මහනුවර | 45 | **45** |
| 05 | මාතලේ | 23 | **23** |
| 06 | නුවරඑළිය | 22 | **22** |
| 07 | ගාල්ල | 33 | **33** |
| 08 | මාතර | 22 | **22** |
| 09 | හම්බන්තොට | 17 | **16** |
| 10 | කුරුණෑගල | 56 | **55** |
| 11 | පුත්තලම | 18 | **18** |
| 12 | අනුරාධපුරය | 42 | **42** |
| 13 | පොලොන්නරුව | 13 | **11** |
| 14 | බදුල්ල | 31 | **31** |
| 15 | මොණරාගල | 18 | **18** |
| 16 | රත්නපුරය | 30 | **30** |
| 17 | කෑගල්ල | 14 | **14** |
| 18 | අම්පාර | 29 | **28** |
| 19 | ත්‍රිකුණාමලය | 22 | **15** |
| 20 | මඩකලපුව | 17 | **12** |
| 21 | වවුනියාව | 8 | **6** |
| 22 | යාපනය | 15 | **15** |
| 23 | මන්නාරම | 12 | **8** |
| 24 | මුලතිව් | 10 | **10** |
| 25 | කිලිනොච්චිය | 8 | **5** |
| එකතුව | | **560** | **532** |

2014 වර්ෂයේදී මන්නාරම දිස්ත්‍රික්කයේ ගොවිජන බැංකු සිලාවතුරෙර ගොවිජන බැංකුවෙහි ණය ලබාදීම් සිදුනොවන බැවින් ඒ වෙනුවට ඉරනෛඉලුප්පෛකඩවල ගොවිජන බැංකුවට ප්‍රාග්ධන මුදල් මාරුකරමින් එම ගොවිජන බැංකුව අලුතින් ආරම්භ කරන ලදී.

මෙරට ගොවිජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීමේ අරමුණු පෙරදැරි කරගෙන, මූල්‍ය ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා දරුවන්ද දායක කර ගැනීම උදෙසා ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය මගින් ළමා ඉතුරුම් ගිණුම් ආරම්භ කිරීමටද අවස්ථාව ලබා දෙන ලදී.

## 10.3 ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතියේ ගනුදෙනු කරන සාමාජිකයින් පිළිබඳවිස්තර.

| | | |
|---|---|---|
| කොටස්කරුවන් සංඛ්‍යාව | - | 470540 |
| තැන්පත්කරුවන් සංඛ්‍යාව | - | 271674 |
| කණ්ඩායම් ගිණුම් සංඛ්‍යාව | - | 35167 |

## 10.4 2014.12.31 දිනට ගොවිජන බැංකු (නියමු) ව්‍යාපාතියේ මූල්‍ය තොරතුරු වලින්කොටසක්පහතපරිදිවේ.

| විස්තරය | ශේෂය (රු.) |
|---|---:|
| ඉතිරි කිරීම් හා ස්ථාවර ගිණුමේ ශේෂය | 402,736,228.00 |
| ජංගම ගිණුමේශේෂය | 81,956,561.00 |
| ණය ගැතියෝ | 1,037,352,728.00 |
| ගොවීන්ගේ කොටස් මුදල් පාලන ගිණුම | 239,766,795.00 |
| ප්‍රාග්ධන ගිණුම | 171,997,085.00 |
| ගොවීන්ගේ ඉතිරි කිරීම් පාලන ගිණුම | 328,283,655.00 |
| ගොවීන්ගේ කණ්ඩායම් පාලන ගිණුම | 101,307,354.00 |

## 10.5 ගොවීන්ගේ භාරකාර අරමුදල මගින් ප්‍රධාන කාර්යාලය හරහා 2014 වර්ෂය තුළදී ගොවිජන බැංකු වෙත ලබාදෙන ලද ප්‍රාග්ධන මුදල් හා ගොවිජන බැංකු ආරම්භයේ සිට 2014.12.31 දක්වා ගොවිජන බැංකු මගින් ණය නිකුත් කිරීම් හා අයවීම් ප්‍රගතිය.

| දිස්ත්‍රික්කය | ප්‍රධාන කාර්යාලය හරහා ලබාදුන් ප්‍රාග්ධනය (රු.) | ණය නිකුත් කිරීම් (රු.) | ණය අය කිරීම් (රු.) |
|---|---:|---:|---:|
| කොළඹ | - | 39,618,511.00 | 29,122,285.00 |
| ගම්පහ | 1,400,000.00 | 274,206,241.00 | 226,952,941.00 |
| කළුතර | - | 66,671,985.00 | 51,270,232.00 |
| මහනුවර | 200,000.00 | 562,690,624.00 | 466,920,423.00 |
| මාතලේ | - | 320,889,912.00 | 264,522,315.00 |

| | | | |
|---|---|---|---|
| නුවරඑළිය | 700,000.00 | 307,975,144.00 | 241,559,884.00 |
| ගාල්ල | 800,000.00 | 216,669,420.00 | 179,330,401.00 |
| මාතර | 1,500,000.00 | 134,430,857.00 | 110,427,589.00 |
| හම්බන්තොට | - | 180,030,022.00 | 156,958,322.00 |
| කුරුණෑගල | 2,000,000.00 | 489,972,937.00 | 398,887,984.00 |
| පුත්තලම | 300,000.00 | 236,539,585.00 | 208,582,090.00 |
| අනුරාධපුරය | 15,500,000.00 | 697,215,207.00 | 635,465,888.00 |
| පොලොන්නරුව | 1,000,000.00 | 848,868,517.00 | 816,651,890.00 |
| බදුල්ල | 7,300,000.00 | 426,962,615.00 | 346,174,989.00 |
| මොණරාගල | 2,100,000.00 | 135,652,588.00 | 91,858,104.00 |
| රත්නපුරය | 500,000.00 | 215,279,040.00 | 176,356,778.00 |
| කෑගල්ල | - | 126,774,234.00 | 53,357,336.00 |
| අම්පාර | - | 347,395,282.00 | 315,666,841.00 |
| ත්‍රිකුණාමලය | - | 19,225,515.00 | 10,571,411.00 |
| මඩකලපුව | - | 44,152,073.00 | 40,710,841.00 |
| වවුනියාව | - | 50,539,298.00 | 33,074,587.00 |
| යාපනය | - | 66,874,020.00 | 53,505,045.00 |
| මන්නාරම | - | 5,904,860.00 | 1,555,500.00 |
| මුලතිව් | - | 8,821,000.00 | 5,311,900.00 |
| කිලිනොච්චි | - | 2,736,000.00 | 2,140,921.00 |
| **එකතුව** | **33,300,000.00** | **5,826,095,487.00** | **4,916,936,495.00** |

# 11.ජල කළමනාකරණ අංශය.

මෙම දෙපාර්තමේන්තුවේ ජල කළමනාකරණ අංශය 1981 වර්ෂයේ ආරම්භ කරන ලදී. දැනට එය ජල කළමනාකරණය පිළිබඳ ඉංජිනේරුවරයකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ.

## 11.1 පවතින මානව සම්පත්.

| | ජල කළමනාකරණ අංශය | දුරස්ථ ගෝචර අංශය |
|---|---|---|
| • ඉංජිනේරු | 02 | - |
| • ඉංජිනේරු සහකාර | 01 | 01 |
| • කාර්මික නිලධාරී | - | 01 |
| • ව්‍යාපෘති සහකාර | - | 01 |
| • සංවර්ධන නිලධාරි | - | 03 |
| • රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | - |
| • කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර | - | 01 |
| • කාර්යාලකාර්ය සහායක | 01 | - |

## 11.2 ජල කළමනාකරණ අංශයේ මෙහෙවර.

2000 අංක 56 දරණ ගොවිජන සංවර්ධන පනතේ 7 වන කොටස "වාරිමාර්ග වැඩ සහ වාරිමාර්ග ජල කළමනාකරණය" යන මාතෘකාව යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් ඉටු කරමින් ශ්‍රී ලංකාවේ සියළුම සුලු (ග්‍රාමීය) වාරිමාර්ග වල ඵලදායීතාවය ඉහල නැංවීම සහ ඒවා විධිමත් ලෙස කළමනාකරණය කිරීම මගින් එහි ආරක්ෂාව සහ සංරක්ෂණය තහවුරු කිරීමට අවශ්‍ය වැඩ සටහන් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම ජල කළමනාකරණ අංශයේ මෙහෙවර වේ. ඒ අනුව 2014 වර්ෂයේ ඉටු කොට ඇති වගකීම් පහතින් දැක්වේ.

### 11.2.1 වැව් ගැඹුරු කිරීම.

IUCN ආයතනය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කල්ලන්චිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ හඳුනාගත් වැව් 05 ක්,Parshell Desilting ක්‍රමවේදය යටතේ ගැඹුරු කිරීමට අවශ්‍ය සමීක්ෂණ අවසන් කරන ලදී.

## 11.2.2 ආහාර බෝග වගා පිළිබඳ තොරතුරු රැස්කිරීම.

මෙරටේ වැවෙන ප්‍රධාන ආහාර බෝග වගාව පිළිබඳ වී වර්ග 03 ක්, පළතුරු වර්ග 11 ක්, එළවළු වර්ග 20 ක් හා අතුරු බෝග 11 ක් පිළිබඳ මාසික තොරතුරු ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා ලබා ගැනීමට හැකි පහසුකම් සලසන ලදී.

## 11.2.3 තත්වපාලනය.

සුළුවාරිමාර්ග ඉදිකිරීම් 47 තත්වපාලන වාර්තා ලබාදීමටත්, ස්ථාන 04ක් සඳහා අත්තිවාරම් පිළිබඳ පස් වාර්තා ලබාදීමටත් හැකිවිය.

## 11.2.4 පාංශු සෞඛ්‍ය කාඩ්පත් නිකුත් කිරීම.

ශ්‍රී ලංකාවේ ප්‍රථම පාංශු සෞඛ්‍ය කාඩ්පත් නිකුත් කිරීමේ අවස්ථාවට මාතලේ දිස්ත්‍රික්කයේ "රාලලාගේ රොටවැව" වැව් 2014-11-21 දින සිදුකිරීම සුවිශේෂී සිදුවීම වේ. මේ යටතේ අක්කර 32 ක් සඳහා ගොවීන් 64 කට මෙම කාඩ්පත් නිකුත් කරන ලදී.

## 11.2.5 වාරිමාර්ග ලිපිගොනු.

දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක වල ගොවිජන සේවා මධ්‍යස්ථාන වල එක් එක් වාරිමාර්ග සඳහා විශේෂ වාරිමාර්ග ලිපිගොනුවක් පවත්වාගෙන යාමට අවශ්‍ය ලිපිගොනු කවර සැපයීමට හැකි විය.

## 11.2.6 දෛනික වර්ෂාපතනමාන සවි කිරීම.

දිවයිනේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 300 ක දෛනික වර්ෂාපතනය මැනීම අඛණ්ඩව සිදුකරගෙන යනු ලැබේ.

## 11.2.7 පුහුණු වැඩසටහන්.

ජල කළමනාකරණ අංශය මගින් පහත සඳහන් පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

| | පුහුණු වැඩ සටහනේ නම | පුහුණු වූ සංඛ්‍යාව | පුහුණු ආයතනය |
|---|---|---|---|
| 1. | කුඹුරු ඉඩම් නාම ලේඛන ප්‍රතිශෝධන වැඩසටහන. | 25 යි. දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස්වරුන් හා ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාරවරුන් | පොතුහැර ජාතික පුහුණු ආයතනය |

## 11.2.8විශේෂ ව්‍යාපෘති .

01. ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ භාරකාර අරමුදල යටතේ ක්‍රියාත්මක වූ "ගං වතුර හා කරදිය පාලන වැඩසටහන" 90% ක් අවසන් කිරීමට හැකිවිය. මෙම වැඩසටහන යටතේ අවසන් වාර්තා පිළියෙල කිරීම 2015 වසරේ පළමු භාගයේදී සිදුවනු ඇත.

02. UNDP ආධාර යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ දේශගුණික විපර්යාස අවම කර ගැනීම සඳහා වන ව්‍යාපෘතියට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීමට ක්‍රියා කරන ලද අතර ඒ සමගම වැව් 05 ක අවසන් සමීක්ෂණ සිදුකරන ලදී.

03. ඩොලර් මිලියන 0.98 ක් වටිනා මොණරාගල හා මඩකලපුව දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන අතහැර දමන ලද වැව් ප්‍රතිසංස්කරණය කිරීම SAARC ව්‍යාපෘතිය යටතේ ගිවිසුම් අත්සන් තැබීමට හැකිවිය.

04. IUCN හා JIRCAS ආයතනය මඟින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරනු ලබන එල්ලංගා අධ්‍යාන කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදෙන ලදී.

## 11.2.8 ප්‍රකාශන.

UNESCAP ආධාර වැඩසටහන යටතේ, ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT) මඟින් ක්‍රියාත්මක කරනු ලබන "නියං පාලන" වැඩසටහන සඳහා අවශ්‍ය "Drought Profile ofSri Lanka " පොත සංස්කරණය කරන ලදී.

එසේම 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හා 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධිත) පනත ඒකාබද්ධ කොට, සියලු සංශෝධන ඇතුලත් තනි පොතක් සංස්කරණය කිරීමට ද අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

එසේම මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථයට බලපාන සියලු පනත් එක්කොට CD තැටියක් නිර්මාණය කරන ලදී.

## 11.2.9 නව හඳුන්වාදීම්.

ස්වයංක්‍රීය ජල උස මැනීම එම අගයයන් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුල ප්‍රදර්ශනය කිරීම හා ඒ අනුව පෙර අනතුරු සංඥා නිකුත් කිරීමට හැකිවීමද මෙම වසරේ ජල කළමනාකරණ අංශය ලද විශේෂ ජයග්‍රහණයකි.

එසේම ඒ ආකාරයටම වර්ෂාපතන දත්ත බලා ගත හැකි වර්ෂාමානයක් නිපදවීමට ද අවශ්‍ය ක්‍රියා 80% ක් පමණ අවසන් කිරීමට හැකිවිය.

## 11.2.10 කෘෂිකාර්මික ඉඩම් ලේඛන ප්‍රතිශෝධනය.

වසර 24 කට පසුව එනම් 1991 න් පසුව ශ්‍රී ලංකාවේ කුඹුරු ඉඩම් නාම ලේඛන ප්‍රතිශෝධන වැඩසටහන සඳහා අවශ්‍ය සියළුම ආකෘති පත්‍ර, උපදෙස් හා පෝස්ටර් මුද්‍රණය කර දෙපාර්තමේන්තුවේ සියළුම ගොවිජන සේවා ප්‍රාදේශීය නිළධාරීන් හා කෘ.ප.නි.ස. වරුන් ද

මේ සඳහා දැනුවත් කිරීමට ක්‍රියා කරන ලදී. මේ යටතේ කුඹුරු ඉඩම් කැබලි මිලියන 1.5ක් සමීක්ෂණය කිරීමට අපේක්ෂා කෙරේ.

## 11.2.11වාරිමාර්ග ගැටළු විසඳීම.

දිවයිනේවිවිධ ප්‍රදේශ වලින් වාරිමාර්ග හා ජල කළමනාකරණ ගැටලු 200 ක් පමණ විසඳීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකර ඇත.

## 11.2.12 ප්‍රදර්ශන.

පාසැල් ප්‍රදර්ශනය සඳහා අවශ්‍ය ජල කළමනාකරණය පිළිබඳ ප්‍රදර්ශන භාණ්ඩ සැපයීමට හැකිවිය.

# 12.මෙහෙයුම් හා ඇගයුම් අංශය.

**2014 වර්ෂය තුල මෙහෙයුම් හා ඇගයුම් අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන් පහතපරිදි වේ.**

1. 2014 වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල ක්‍රියාකාරී සැලැස්ම (Annual Action Plan) සකස්කිරීම.
2. ක්‍රියාකාරී සැලැස්මට අදාලව දිස්ත්‍රික් මට්ටමින් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම හා ප්‍රගති සමාලෝචන කටයුතු කිරීම.
3. දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන සියළුම සංවර්ධන වැඩ සටහන් වල (දිස්ත්‍රික් මට්ටමින්) මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම හා එම වාර්තා අමාත්‍යාංශය හා විගණන අංශය වෙත ඉදිරිපත් කිරීම.
4. මහජනතාවට වඩාත් හිතකර හා කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා යල්පැනගිය පීඩාකාරී නීති රෙගුලාසි සරල කිරීම, සංශෝධනය කිරීම සහ ඉවත් කිරීම පිළිබඳව අධ්‍යනයක් සිදුකර නිර්දේශ සැපයීම (Red Tape Challenges) වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල මූලික සැලසුම් සකස් කිරීම හා අදාල චක්‍රලේඛ, චක්‍රලේඛ ලිපි රැස්කිරීම හා ලේඛන ගත කිරීම.

………………☺☺☺☺☺☺☺☺☺☺………………

**ඇමුණුම 01.**

## සුළු වාරි මාර්ග (වැව්) ප්‍රතිසංස්කරණ වාර්තාව.

| | දිස්ත්‍රික්කය | කර්මාන්තයේ නම | භෞතික ප්‍රගතිය | ගිවිසුම්ගත මුදල |
|---|---|---|---|---|
| | අනුරාධපුරය | | | |
| 01 | | කොටගල වැව | 100% | 3,909,379.50 |
| 02 | | අලුත්ගම වැව | 100% | 5,249,295.00 |
| 03 | | ඇටඋරුලැව | 100% | 10,114,290.00 |
| 04 | | ගල්හිරියාව වැව | 100% | 7,110,510.00 |
| 05 | | උණුම්කෙ වැව | 100% | 9,357,688.00 |
| 06 | | නික වැව | 100% | 9,270,875.00 |
| 07 | | පරගහ උල්පත වැව | 100% | 9,962,620.00 |
| 08 | | පහල කුඹුක්ගොල්ලෑව වැව | 100% | 6,748,452.18 |
| 09 | | ඇළපත් වැව | 100% | 9,058,391.70 |
| 10 | | නික වැව ගලසොරොව්ව වැව | 100% | 5,714,470.00 |
| 11 | | කරුවලගස් වැව | 100% | 9,118,890.00 |
| 12 | | වෙම්බුකුළම ජලාශය | 100% | 6,817,639.00 |
| 13 | | ඉහළ තිබ්බටුවාගම වැව | 100% | 5,132,900.00 |
| 14 | | මහතම්මැන්නාව වැව | 100% | 9,312,080.00 |
| 15 | | කඩහැට ජලාශය | 100% | 7,415,783.50 |
| 16 | | කටුගම්පලයාගම | 100% | 9,001,135.00 |
| 17 | | පහළ ලොලුගස් වැව | 100% | 5,541,832.00 |
| 18 | | ඉහළ උපතිස්ගම | 100% | 7,750,877.00 |
| 19 | | විහාර තම්මැන්නාව | 100% | 8,543,695.00 |
| 20 | | පනක්ක වැව | 100% | 8,989,196.70 |
| 21 | | ඉහළ පරසන්ගස් වැව ජලාශය | 100% | 6,538,356.00 |
| 22 | | මීගස් වැව (බුලන්කුළම) | 100% | 9,059,052.00 |
| 23 | | මීගහ වැව(වීර වැව) | 100% | 7,573,412.50 |
| 24 | | උණගස් වැව | 100% | 6,187,984.00 |
| 25 | | උළගගම වැව | 100% | 7,443,750.00 |
| 26 | | කිඩපලගම වැව | 100% | 7,203,887.50 |

| | | | | |
|---|---|---|---|---|
| 27 | | ඉට්ටිකට්ටිය වැව | 100% | 8,848,477.50 |
| 28 | | වෙල්ලමොරණ පුරාණ වැව | 100% | 7,815,210.00 |
| 29 | | කිරිමැටියාව | 100% | 5,795,900.00 |
| 30 | | කන්නට්ටිය වැව | 100% | 7,186,400.00 |
| 31 | | නාන්වතේගම වැව | 100% | 7,180,100.00 |
| 32 | | අඹගස් වැව | 100% | 9,262,200.00 |
| 33 | | කටුගහරඹ වැව | 100% | 7,581,850.00 |
| 34 | | දිගනගම වැව | 100% | 6,019,450.00 |
| 35 | | කළුවරගස් වැව | 100% | 5,661,258.00 |
| 36 | | පළුගස් වැව | 100% | 9,427,810.00 |
| 37 | | ඉහල අලියා වැටුණ වැව | 100% | 6,405,875.00 |
| 38 | | තමරකුළම | 100% | 9,689,030.00 |
| 39 | | තම්මැන්නාව වැව | 100% | 4,444,105.00 |
| 40 | | හබදෙවුල් වැව | 100% | 6,441,422.50 |
| 41 | | දමුන්නෑව වැව | 100% | 9,361,403.00 |
| 42 | | ගල්කඩවල මහ වැව | 100% | 8,647,103.20 |
| 43 | | මහ කටුවරගල වැව | 100% | 6,850,730.00 |
| 44 | | වෙහෙර වැව | 100% | 8,655,460.00 |
| 45 | | ඉදිගහ වැව | 100% | 7,850,400.00 |
| 46 | | මරික්කරගම වැව | 100% | 9,729,765.00 |
| 47 | | නික වැව | 100% | 7,798,750.00 |
| 48 | | වෙල්ලමුඩාව වැව | 100% | 6,759,657.00 |
| 49 | | ඉහල වැව | 100% | 3,743,847.50 |
| 50 | | කරඹ වැව | 100% | 8,451,487.50 |
| 51 | | රඹකුළම දඹු වැව | 100% | 5,452,135.00 |
| 52 | | කුඩාදඹු වැව | 100% | 3,927,406.00 |
| 53 | | මිරිහානගම වැව අදියර I | 100% | 5,382,832.50 |
| 54 | | මිරිහානගම වැව අදියර II | 100% | 5,718,690.00 |

| | | | | |
|---|---|---|---|---|
| 55 | | නිතුල්ල ගස් වැව | 100% | 4,060,940.00 |
| 56 | | පනික්කන් කුළම | 100% | 6,924,453.00 |
| 57 | | ඉහලගම ජලාශය | 100% | 7,454,219.00 |
| 58 | | වල්පළුව වැව | 100% | 6,347,530.50 |
| 59 | | මහ හෙළඹ වැව | 100% | 7,470,200.50 |
| 60 | | කයන් වැව | 100% | 6,346,835.00 |
| 61 | | නෙතුල්ගස් වැව | 100% | 5,353,623.00 |
| 62 | | මහ පොතන දිවුල් වැව | 100% | 8,722,880.00 |
| 63 | | පොතනගම ජලාශය | 100% | 3,864,625.00 |
| 64 | | අමුණුකොළ වැව | 100% | 6,765,425.00 |
| 65 | | සන්දිගේ වැව | 100% | 4,695,982.00 |
| 66 | | පුංචිහල්මිල්ල වැව | 100% | 5,590,044.50 |
| 67 | | කිරිහපුව වැව | 100% | 4,801,240.00 |
| 68 | | මුස්ලිම් දිවුල් වැව | 100% | 7,997,965.00 |
| 69 | | ඇටවීරගොල්ල කුඩා වැව | 100% | 7,288,102.50 |
| 70 | | කුඹුක්ගොල්ලෑව | 100% | 9,534,260.00 |
| 71 | | නෙලුගොල්ලෙකඩ වැව | 100% | 5,431,030.00 |
| 72 | | රඹ වැව | 100% | 7,853,425.00 |
| 73 | | රත්මල්ගහ වැව | 100% | 5,465,403.00 |
| 74 | | පහල ඔලුගොල්ලෑව වැව | 100% | 5,140,193.50 |
| 75 | | කටුගම්පොල වැව | 100% | 8,716,989.45 |
| 76 | | රලපනාව වැව | 100% | 6,944,790.00 |
| **77** | | තම්මැන්නාගම වැව අදියර I | 100% | **7,851,808.50** |
| 78 | | තම්මැන්නාගම වැව අදියර II | 100% | **9,015,000.00** |
| | **වව්නියාව** | | | |
| 01 | | අම්මිවෙයිතන්කුළම් | 100% | 4,102,745.80 |
| 02 | | සින්නකුළම් | 100% | 5,404,140.00 |
| 03 | | පනික්කර්පුලියන් කුළම් | 100% | 5,963,425.00 |
| 04 | | පිරමියන් කුළම් | 100% | 3,938,246.00 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | | පුඩුක්කන් කුළම් | 100% | 8,677,397.60 |
| 06 | | නගර් කුළම් | 100% | 4,402,440.50 |
| 07 | | කට් කුළම් | 100% | 6,469,800.00 |
| 08 | | පහලපුතුක් කුළම් | 100% | 5,906,612.00 |
| 09 | | නොච්චි කුළම් | 100% | 7,731,974.40 |
| 10 | | පුතුක් කුළම් | 100% | 7,721,203.90 |
| 11 | | කුරුන්දන් කුළම් | 100% | 5,307,875.00 |
| 12 | | පරනඩ්ඩිනකල් කුළම් | 100% | 7,808,709.00 |
| 13 | | එම්පල් කුළම් | 100% | 5,633,776.00 |
| 14 | | පෙරිය සිප්පි කුළම් | 100% | 2,920,733.00 |
| 15 | | වකයිකට්ටිය උල්ලු කුළම් | 100% | 8,664,869.00 |
| 16 | | පනිච්චන් කුළම් | 100% | 7,350,613.50 |
| 17 | | නරුවිලික් කුළම් | 100% | 6,383,958.50 |
| 18 | | පිරප්පන් කුළම් | 100% | 7,172,829.50 |
| 19 | | සූදුවෙන්තපිලව් කුළම් | 100% | 3,384,729.00 |
| 20 | | පුල්වනවූර් කුළම් | 100% | 6,179,595.00 |
| 21 | | වෙලන් කුළම් | 100% | 7,725,806.00 |
| 22 | | කළුකුන්ඩන් මඩුව ජලාශය | 100% | 6,935,400.00 |
| | | | | **135,786,878.70** |
| | කිළිනොච්චි | | | |
| 01 | | ඒච්චන් කුළම් | 100% | 3,583,000.00 |
| 02 | | අමායිපල්ලම් කුළම් | 100% | 3,437,406.00 |
| | | | | **7,020,406.00** |
| | ත්‍රිකුණාමලේ | | | |
| 01 | | පාලුගස් වැව | 100% | **939,230.80** |
| 02 | | තිම්බිරි වැව | 100% | **1,462,863ග50** |
| 03 | | මහ තිම්බිරි වැව | 100% | **2,689,789ග54** |
| 04 | | කුඩා පහල වැව | 100% | **845,640.00** |
| 05 | | අවර වැව හස ඇල | 100% | **523,558.31** |

| | | | | |
|---|---|---|---|---|
| 06 | | එප්පාගම කාට්ටක්කුඩුව අමුන | 100% | **1,281,645.00** |
| 07 | | තලගස් වැව | 100% | **1,300,154.00** |
| 08 | | කුරින්ජන් කුලම් | 100% | **2,721,948.50** |
| 09 | | කුඩා විල්පානකුලම සිට තිබ්රි වැව ඇල | 100% | **1,027,982.50** |
| 10 | | බෙල්ලකනඩවෙල | 100% | **3,297,219.00** |
| 11 | | දෙමට වැව | 100% | **2,331,008.60** |
| 12 | | කුඩකනඩමල වැව | 100% | **442,573.80** |
| 13 | | පුලිකන්දිකුලම් පහලවැව | 100% | **1,831,808.90** |
| 14 | | මහපනිකෙට්ටියා වැව | 100% | **1,992,002.10** |
| 15 | | මයිලකුඩා වැව | 100% | **1,628,411.13** |
| 16 | | ඉලුප්පායිකුලම් | 100% | **399,000.00** |
| 17 | | කොම්බන්කුලම් | 100% | **2,417,365.40** |
| 18 | | පන්මාතවච්චිස්මීම් ඇල පාර | 100% | **2,346,907.60** |
| | | | | **29,479,108.68** |
| | යාපනය | | | |
| 01 | | පුවරාසන්කුලම් | 100% | **637,442.00** |
| 02 | | වෙඩ්ඩුක්කුලම් | 100% | **483,142.00** |
| 03 | | පල්ලත්තුකුලම් | 100% | **1,453,003.24** |
| 04 | | කූඩායිකිරායිකුලම් | 100% | **1,820,567.70** |
| 05 | | වේඩ්ඩුකුලම් | 100% | **1,254,617.77** |
| 06 | | නාරුබන්තාල්කුලම් | 100% | **1,629,947.43** |
| 07 | | කනික්කුලම්(අම්පලත්තලායිකුලම්) | 100% | **619,160.63** |
| 08 | | පූලන්තෝඩ්ඩකුලම් | 100% | **2,086,076.24** |
| 09 | | රාමන්කුන්ඩු | 100% | **1,404,167.04** |
| 10 | | උනවත්තායි වැනල් | 100% | **2,981,771.04** |
| 11 | | ආරඩුවේලිකුලම් | 100% | **870,436.19** |
| 12 | | වේලාවාරික් කුලම් සහ ඇල | 100% | **1,845,819.28** |
| 13 | | සම්පාවේලි කුලම් | 100% | **2,485,911.19** |

| | | | | |
|---|---|---|---|---|
| 14 | | කන්නාරයික්කුලම් | 100% | **520,356.49** |
| 15 | | උවුයිල් කුලම් | 100% | **1,559,962.59** |
| 16 | | ඉරතාවිල්කුලම් සහ ඇල | 100% | **2,073,410.04** |
| 17 | | ඇලඩික් කුලම් | 100% | **1,118,064.79** |
| 18 | | නාන්තාවිල් සින්න කුලම් | 100% | **814,785.35** |
| 19 | | කෝරවායල් කුලම් | 100% | **1,171,024.24** |
| 20 | | නුනුක්කාන් කුලම් සහ ඇල | 100% | **2,247,993.33** |
| 21 | | තානුයිල් කුලම් | 100% | **706,871.75** |
| 22 | | සින්න කුලම් | 100% | **630,896.34** |
| 23 | | අම්මාන් කොයවිල්කුලම් | 100% | **1,126,579.69** |
| 24 | | වේලම්කිරායි කුලම් | 100% | **2,135,881.27** |
| 25 | | ඉඩිකේඩංකු කුලම් | 100% | **2,639,935.81** |
| 26 | | පුඩ්ඩුනි කුලම් | 100% | **585,239.12** |
| 27 | | කෙරිනික්කරායි කුලම් | 100% | **1,001,165.29** |
| 28 | | ආනයිවිලුඅන්තාන් ඇල | 100% | **813,209.15** |
| 29 | | නවෙමාර් කොවිලාඩි ඇල | 100% | **1,243,633.49** |
| 30 | | ආරියවාන් කුලවේලි ඇල | 100% | **1,332,247.99** |
| 31 | | තිල්ලායි වෙලික්කුලම් | 100% | **680,610.72** |
| 32 | | නල්ලතාන්නිර් කුලම් | 100% | **1,759,899.92** |
| | | | | **43,733,829.12** |

**ඇමුණුම 02.**

## කෘෂි පාර සංවර්ධන වාර්තාව

| අංකය | දිස්ත්‍රික්කය | කර්මාන්තය | භෞතික ප්‍රගතිය | ගිවිසුම්ගත මුදල |
|---|---|---|---|---|
| | වව්නියාව | | | |
| 01 | | බෝගස්වැව 1, 3වන පටුමගේ සිට 5වන පටුමග දක්වා | 100% | 4190510.00 |
| 02 | | සැළලිහිණිගම 6 වන පටුමගේ සිට 12 වන පටුමග දක්වා | 100% | 8,410,500.00 |
| 03 | | බෝගස්වැව1, 12 වන පටුමගේ සිට 14වන පටුමග දක්වා | 100% | 4513718.00 |
| 04 | | බෝගස්වැව 1, 15වන පටුමගේ සිට 17වන පටුමග දක්වා | 100% | 4375739.29 |
| 05 | | බෝගස්වැව 1, 18වන පටුමගේ සිට 22වන පටුමග දක්වා | 100% | 6985566.36 |
| 06 | | බෝගස්වැව 1, 9වන පටුමගේ සිට 11වන පටුමග දක්වා | 100% | 4180593.39 |
| 07 | | බෝගස්වැව 1, 1වන පටුමගේ සිට 2වන පටුමග දක්වා | 100% | 4217217.50 |
| 08 | | බෝගස්වැව 11, 1වන පටුමගේ සිට 3වන පටුමග දක්වා | 100% | 3934652.65 |
| 09 | | බෝගස්වැව 11, 4වන පටුමගේ සිට 6වන පටුමග දක්වා | 100% | 3682693.02 |
| 10 | | බෝගස්වැව 11, 7වන පටුමගේ සිට 9වන පටුමග දක්වා | 100% | 4028316.03 |
| 11 | | බෝගස්වැව 11,10වන පටුමගේ සිට12වන පටුමග දක්වා | 100% | 4524035.39 |
| 12 | | බෝගස්වැව 11,13වන පටුමගේ සිට15වන පටුමග දක්වා | 100% | 4249682.00 |
| 13 | | බෝගස්වැව11,16වන පටුමගේ සිට 18වන පටුමග දක්වා | 100% | 4303984.65 |
| 14 | | බෝගස්වැව 11,19වන පටුමගේ සිට21වන පටුමග දක්වා | 100% | 3819297.00 |
| 15 | | නාමල්ගම 1වන පටුමගේ සිට 6වන පටුමග දක්වා | 100% | 9219750.00 |
| 16 | | නාමල්ගම 7වන පටුමගේ සිට 12 වන පටුමග දක්වා | 100% | 5142800.07 |
| 17 | | නාමල්ගම 13වන පටුමගේ සිට 19වන පටුමග දක්වා | 100% | 9147131.80 |
| 18 | | නාමල්ගම 19 වන පටුමගේ සිට 22වන පටුමග දක්වා | 100% | 3770021.14 |
| 19 | | නන්දිමිත්‍රගම 1වන පටුමගේ සිට 5වන පටුමග දක්වා | 100% | 6305836.93 |
| 20 | | සැළලිහිණිගම 1වන පටුමගේ සිට 6වන පටුමග දක්වා | 100% | 8498305.40 |
| 21 | | සැළලිහිණිගම 13වන පටුමගේ සිට14 වන පටුමග දක්වා | 100% | 2736966.54 |
| 22 | | බෝගස් වැව්, 6 වන පටුමගේ සිට 8 වන පටුමග දක්වා | 100% | 4269012.40 |
| 23 | | උළුක්කුලම ඒකකය, 1 පාර | 100% | 2955293.42 |
| 24 | | 7වන කොටසේ පාර | 100% | 3838687.16 |

| | | | | |
|---|---|---|---|---|
| 25 | | 7වන කොටසේ අතුරු පාර | 100% | 5597251.99 |
| 26 | | පල්ලේරුව පුමදුව පාර | 100% | 4378765.00 |
| 27 | | අවරන්තලාව ඒකක1අමතර පාර | 100% | 2936278.20 |
| 28 | | හෙලඹ වැව පාර | 100% | 2464736.36 |
| 29 | | අවරන්හලාව පල්ලේ ඉවුර බැම්ම පාර | 100% | 3480907.68 |
| 30 | | අලගර සමරකුලම් කෘෂි පාර | 100% | 1630085.45 |
| | | | | **141,788,334.82** |
| | අනුරාධපුරය | | | |
| 01 | | බලය වැව ඩි 14 සිට එල් බි 5 කෘෂිපාර | 100% | 5456238.00 |
| 02 | | රුවන්පුර ඩි 21 සිට එල් බි 21 කෘෂිපාර | 100% | 5789145.50 |
| 03 | | අළුත්හල්මිල්ලේව සිට රත්මලේ කෘෂිපාර | 100% | 6248212.05 |
| 04 | | අලිකිම්බුලේගල ඩි 5 සිට එල් බි 7 වි කෘෂිපාර | 100% | 5479790.00 |
| 05 | | බි යාය සිට එල් බි 2 කෘෂිපාර | 100% | 5414982.80 |
| 06 | | තමරගල පන්සලේ සිට වඩ්ඩාගම කුඹුළු දක්වා | 100% | 3144490.29 |
| 07 | | විජයරත්න පන්සල් පාරේ සිට කුඹුර පාර (506 කඩ) | 100% | 4797716.10 |
| 08 | | 161 කුඩා ගලෙන් බිදුනු වැව සියබලා වැව සිට ගලෙන් බිදුනු වැව දක්වා | 100% | 8991733.65 |
| 09 | | ඉලුබ්බඩයගම සිට කුඹුර දක්වා | 100% | 4901682.79 |
| 10 | | මාන්කුලන් වැවේ සිට කුඹුර දක්වා | 100% | 5160286.49 |
| 11 | | ඉලුක් වැව ජෝන් නිවසේ සිට කුඹුර දක්වා | 100% | 6005528.04 |
| 12 | | ඉලුප්පුකන්නිය සිට කරුවලගස් වැව සිට යකල්ල පාසල සිට කුඹුර දක්වා | 100% | 4918923.57 |
| 13 | | පියසේන නිවසේ සිට සම්පත්ගම දක්වා | 100% | 4720758.13 |
| 14 | | හුරුණුනික වැව සිට ඩී.05 ඇල හා කුඹුර | 75% | 3496455.21 |
| 15 | | කෘෂි පාර සිට ජනසිරිගම සිට කුඹුර දක්වා | 100% | 4822413.21 |
| 16 | | කුඩපලදික්කුළම සිට කුඹුර දක්වා | 100% | 3178107.83 |
| 17 | | කලතව, අරුනගම කෘෂිපාර | 100% | 4517682.25 |
| 18 | | කටුගම්පල ස්පිල් රෝඩ් | 100% | 4369320.47 |
| 19 | | කටුගම්පල සිට යෝධ ඇල කෘෂිපාර | 100% | 2241341.02 |
| 20 | | පතිරත්න නිවස සිට කනදරාව ජලාශය | 100% | 5666033.80 |

| | | | | |
|---|---|---|---|---|
| 21 | | රඹේව ගම සිට අමුණ දෙසට | 100% | 3441426.40 |
| 22 | | BOP 607උස්සාන පාර රොබට් නිවස අසල සිට නිමල් කඩය දක්වා | 100% | 4311286.07 |
| 23 | | යාය 18 විමලදාස නිවස සිට නිලාබැම්ම පාර දක්වා | 100% | 4510781.15 |
| 24 | | පෙමදූව,කනත්ත ඉදිරිපිට කෘෂිපාර | 100% | 5166047.56 |
| 25 | | නාරංගස් වැව පහල පාරේ ට්‍රාන්ස්ෆෝමරයේ සිට උල්පත්යාය පන්සල් පාර | 100% | 4658415.00 |
| 26 | | ජනසවිගම සිට කුඹුර දක්වා කෘෂිපාර | 100% | 3808146.63 |
| 27 | | වටරැක්කාව කෘෂිපාර | 100% | 1486114.40 |
| 28 | | සමදිගම සිට සියඹලාව කුඹුර කෘෂිපාර | 100% | 5087317.26 |
| 29 | | කොහොඹගස්කඩ ගම සිට බඹරහෙළ කෘෂිපාර | 100% | 4211144.26 |
| 30 | | තුරුක්කුරාගම කෘෂිපාර | 100% | 2284931.40 |
| 31 | | සිව්දිසාගම ඇතුල්වීමේ පාර සිට ගම අවසානය | 100% | 3783181.40 |
| 32 | | රන්පත් විල මුස්ලිම් පල්ලියේ සිට ඇල්ල වැව කුඹුර දක්වා | 100% | 1963257.31 |
| 33 | | ප්‍රධාන ජලාශ කණ්ඩිය පාර සිට කුඹුර කෘෂිපාර හා අනෙක් පාරවල් | 100% | 3249592.26 |
| 34 | | ඉහලකාගම ට්‍රාන්ස්පෝටරය සිට පල්විල්ලාව වලට කෘෂි පාර | 100% | 4233826.00 |
| 35 | | ඉහලගම ප්‍රධාන පාර සිට ජය ගඟ කෘෂිපාර | 100% | 9860384.48 |
| 36 | | ඉහලවැව පාර සිට මහගලගම ජලාශ කෘෂිපාර | 100% | 4611112.66 |
| 37 | | යෝධ ඇළ අතුරු මාර්ගය සිට කලංසූරිය නිවස දක්වා | 100% | 3456000.34 |
| 38 | | වසන්ත ගෙදර සිට ඇටවීර ගෙල්ලැව කෘෂිපාරට | 100% | 1357734.00 |
| 39 | | රන්පත් විල නිවාස 30 ප්‍රධාන පාර සිට වැව පෝෂිත ප්‍රදේශයේ කෘෂිපාරට | 100% | 1341200.01 |
| 40 | | කිරිගල්වැව ගමේ සිට ජලාශය දක්වා කෘෂි පාර | 100% | 3208978.28 |
| 41 | | පළු කෙටු වැව කෘෂිපාර | 100% | 1535734.58 |
| 42 | | දිවුලේ වැව සිට බඹරහෙල කෘෂි පාර දක්වා | 100% | 3741435.56 |
| 43 | | ඊතල වැටුණ වැව සිට හඳගම කෘෂි පාර | 100% | 1362420.50 |
| 44 | | රන්පත් විල සිට මොරගහවෙල කෘෂි පාර | 100% | 3773519.24 |
| 45 | | ඇල්ල වැව පාලමේ සිට සන්දිගේ වැව කෘෂි පාර | 100% | 1272393.51 |

| | | | | |
|---|---|---|---|---|
| 46 | | කුරුඳු වැව කෘෂි පාර | 100% | 3217982.72 |
| 47 | | මිද්දේ වෙල සිට බුල්නෑව බෞද්ධ මධ්‍යස්ථානය දක්වා | 100% | 4176046.16 |
| 48 | | තොටනේගම 304 ඩී 1 ප්‍රේමසිරි නිවාස දක්වා | 100% | 2865527.99 |
| 49 | | පුලියන් කුලම පන්සලේ සිට ඇතිනි වැටුනු වැව දක්වා | 100% | 4221110.00 |
| 50 | | සියඹලා ගමුව සිට ඉදිගොල්ල ගම දක්වා | 100% | 4017289.47 |
| 51 | | කරුවල ගස්වැව සිට උස්ගල කෘෂි පාර | 100% | 4064324.17 |
| 52 | | බුල්නෑව සිට මුලන්නාටුව කෘෂි පාර දක්වා | 100% | 4325722.66 |
| 53 | | ගන්තිරිය ගම ගමමැද කෘෂි පාර | 100% | 3762034.69 |
| 54 | | සුචරිත් ගම මල්වතු ඔය පාර | 100% | 4259787.22 |
| 55 | | කීරික් කුලම ජලාශ බැම්මේ සිට ගුවන් තොටුපල පාර දක්වා | 100% | 3455634.35 |
| 56 | | ඉත්තේ වැව කෘෂි පාර | 100% | 3526126.76 |
| 57 | | දියමයිලගස්වැව මායිම් පාර | 100% | 1080101.30 |
| 58 | | දියමයිලගස්වැව කෘෂි පාර | 100% | 1855575.20 |
| 59 | | දියමයිලගස්වැව සිට කුඩා වැව | 100% | 2187854.77 |
| 60 | | ගෝනෑව / මහ වැව මන්සනදිය තෙක් පළුකුඹුර වැව දක්වා කෘෂි පාර | 100% | 4748937.40 |
| 61 | | පරසන් ගස්වැව මන්සන්දිය පාර සිට මැදගම දක්වා | 100% | 4577715.16 |
| 62 | | මනඹුරන් කුලන් ප්‍රධාන පාරේ සිට සොමමලගම දක්වා කෘෂි පාර | 100% | 4798822.00 |
| 63 | | කටුගම්පලම පාර සිට කොරටි අක්කරය පාර දක්වා | 100% | 6961894.44 |
| 64 | | මහමන්කඩල ඉහල වැව කෘෂි පාර | 100% | 6506658.68 |
| 65 | | පහල කංහිදියාගම කෘෂි පාර | 100% | 2077124.97 |
| 66 | | ධච්චාමිල්නෑව කෘෂි පාර අදියර 2 | 100% | 2343703.87 |
| 67 | | කොට වැව කෘෂි පාර | 100% | 1649494.41 |
| 68 | | ධච්චාමිල්නෑව පහල වැව කෘෂි පාර | 100% | 2435506.00 |
| 69 | | ජන සවිය කෘෂි පාර | 100% | 1986029.46 |
| | | | | **272138225.30** |
| | | | | |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| | මුලතිව් | | | |
| 01 | | රනවිරු ගම්මාන කෘෂි පාර | 100% | 8159622.70 |
| 02 | | වෙහෙර තැන්න අදියර 1 කෘෂි පාර | 100% | 8415761.60 |
| 03 | | වෙහෙර තැන්න අදියර 11 කෘෂි පාර | 100% | 8442019.74 |
| 04 | | වෙහෙර තැන්න අදියර 111 කෘෂි පාර | 100% | 8244517.10 |
| 05 | | ඇතා වැටුනු වැව 11 කෘෂි පාර | 100% | 5082501.82 |
| 06 | | කිරිඉබ්බන් වැව කෘෂි පාර | 100% | 8074821.70 |
| 07 | | ජනක පුර 2 වෙහෙරතැන්න කෘෂි පාර | 100% | 5249502.80 |
| 08 | | ඇතා වැටුනු වැව වම කෘෂි පාර | 100% | 8047494.48 |
| 09 | | නිකවැව වම 2 කෘෂි පාර | 100% | 6560504.64 |
| 10 | | ඇහැටුගස්වැව කෘෂි පාර | 100% | 7210436.60 |
| 11 | | ඇහැටුගස්වැව දකුණු කෘෂි පාර | 100% | 6908880.80 |
| 12 | | ජනක පුර 1 කෘෂි පාර | 100% | 7258673.52 |
| 13 | | නිකවැව වම 1 කෘෂි පාර | 100% | 7452527.14 |
| | | | | **95107264.64** |
| | ත්‍රිකුණාමලේ | | | |
| 1 | | නල්ලූර් පාර, තොපූර් | 100% | 9516542.35 |
| 2 | | මැදපාර | 100% | 4145485.00 |
| 3 | | මහින්දපුර පාර | 100% | 4151903.16 |
| 4 | | මවඩයි වෙනායි පාසල පාර | 100% | 1530304.02 |
| 5 | | තුම්පර පාර | 100% | 3948537.50 |
| 6 | | කනත්ත පාර | 100% | 3896342.00 |
| 7 | | පාටලිපුරම් සින්න කුලම් පාර | 100% | 2953725.00 |
| 8 | | සින්න කුලම් ශ්‍රී නිවාස පුරම් පාර | 100% | 3148270.00 |
| 9 | | පන්මතවච්චි ජනපද ඇල පාර | 100% | 1957167.02 |
| | | | | **35248276.05** |
| | යාපනය | | | |
| 1 | | මජ්පනාර් කඩ්ඩමොඩයිලාඩ් කෘෂි පාර | 100% | 1556739.24 |
| 2 | | කත්තලම්පිඩ්ඩි කෘෂි පාර | 100% | 2040782.08 |

| | | | | |
|---|---|---|---|---|
| 3 | | තනුවිල් කෘෂි පාර | 100% | 1765997.33 |
| 4 | | කුන්ච්චැලි කෘෂි පාර | 100% | 1447786.96 |
| 5 | | සූලකුන්ඩනකෘෂි පාර | 100% | 1369632.60 |
| 6 | | සිරිඋපිඩි ඊස්ට් කිරි චෛති | 100% | 2197585.08 |
| 7 | | පදයන් කඩ්ඩු සන්කු පුඩ්ඩි කෘෂි පාර | 100% | 2534418.13 |
| 8 | | වෙන් කුල කෘෂි පාර | 100% | 863033.62 |
| | | | | **13775975.04** |

ඇමුණුම 03.

| දිස්ත්‍රික්කය | බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවිය | | | කෘෂි උපකරණ අලෙවි වටිනාකම (රු.) | නිෂ්පාදන අලෙවි වටිනාකම (රු.) | වෙනත් අලෙවි කටයුතු වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|
| | බිත්තර වී සැපයුම් බුසල් ß | එළවළු හා වෙනත් බීජ වටිනාකම (රු.) | පැල වර්ග වටිනාකම (රු.) | | | |
| කොළඹ | 67.69 | 4,765,832.00 | 2,120,995.00 | 476,620.00 | 00 | 700.00 |
| ගම්පහ | 16,768.00 | 3,127,847.50 | 7,118,093.00 | 1,590,287.00 | 220,429.00 | 1,028,297.00 |
| කළුතර | 2,512.25 | 317,507.61 | 904,752.00 | 321,278.00 | 15,080.00 | 29,420.00 |
| මහනුවර | 618.00 | 336,253.00 | 64,413.00 | 1,547,301.00 | 54,425.00 | 99,074.00 |
| මාතලේ | 3,191.00 | 639,131.50 | 408,910.60 | 3,808,872.25 | 119,425.00 | 3,446,663.25 |
| නුවරඑළිය | 227.00 | 1,039,982.70 | 1,943,320.00 | 13,296,212.75 | 273,576.25 | 2,230,961.00 |
| ගාල්ල | 3,416.00 | 735,066.30 | 1,230,060.00 | 318,308.00 | 821,117.00 | 3,411,018.00 |
| මාතර | 3,230.00 | 355,713.00 | 87,111.00 | 455,252.00 | 97,245.00 | 79,988.00 |
| හම්බන්තොට | 292.00 | 56,436.00 | 2,669.00 | 28,872.50 | 00 | 3,604.00 |
| කුරුණෑගල | 10,910.00 | 1,476,854.50 | 573,055.00 | 1,172,425.00 | 671,260.00 | 1,248,625.00 |
| පුත්තලම | 5,570.00 | 783,423.00 | 1,156,835.00 | 847,096.25 | 7,200.00 | 29,375.00 |
| අනුරාධපුරය | 107,463.00 | 355,945.00 | 423,405.00 | 51,230.00 | 110,400.00 | 84,367.00 |
| පො'නරුව | 1,886.00 | 241,360.50 | 7,480.00 | 596,368.75 | 00 | 31,480.00 |
| බදුල්ල | 931.00 | 6,100,219.75 | 21,422.00 | 3,539,243.75 | 17,567.50 | 299,260.00 |
| මොණරාගල | 687.00 | 99,191.00 | 3,655.00 | 298,965.00 | 00 | 4,800.00 |
| රත්නපුරය | 56,648.95 | 879,317.90 | 598,075.00 | 467,250.75 | 1,140.00 | 249,461.00 |
| කෑගල්ල | 147,633.00 | 390,961.00 | 504,876.00 | 1,583,862.00 | 70,300.00 | 128,329.00 |
| අම්පාර | 113.00 | 201,190.00 | 00 | 950.00 | 00 | 00 |
| ත්‍රිකුණාමලය | 71.00 | 3,645.00 | 72,700.00 | 00 | 9,500.00 | 294,382.00 |
| මඩකලපුව | 1,272.00 | 441,637.50 | 9,058.50 | 00 | 305.00 | 192,495.00 |
| යාපනය | 1.00 | 45,895.00 | 00 | 33,750.00 | 00 | 00 |
| කිලිනොච්චිය | 00 | 3,625.00 | 00 | 00 | 00 | 00 |
| මන්නාරම | 00 | 44,710.00 | 00 | 00 | 00 | 00 |
| වවුනියාව | 1,933.00 | 162,608.00 | **3,383,384.00** | 1,850.00 | 00 | 3,900.00 |
| මුලතිව් | 00 | 798.00 | 00 | 00 | 00 | 00 |
| එකතුව | **365,440.89** | **22,605,150.76** | **20,634,269.10** | **30,435,995.00** | **2,488,969.75** | **12,896,199.25** |

ඇමුණුම 04.

## 2006 වර්ෂයේ සිට 2014.12.31දින දක්වා වාර්ෂික ගිණුම් වාර්තාලැබීමේ ප්‍රගතිය.

- යාපනය 2006 මධ්‍යස්ථාන 13 කි.

| අංකය | දිස්ත්‍රික්කය | මධ්‍යස්ථාන ගණන | වර්ෂයන් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
| 01. | කොළඹ | 09 | 07 | 06 | 07 | 06 | 07 | 08 | 08 | 06 |
| 02. | ගම්පහ | 26 | 26 | 26 | 26 | 26 | 26 | 26 | 26 | 26 |
| 03. | කළුතර | 20 | 19 | 18 | 18 | 18 | 16 | 17 | 15 | 15 |
| 04. | මහනුවර | 45 | 45 | 45 | 45 | 45 | 45 | 45 | 40 | 28 |
| 05. | මාතලේ | 23 | 23 | 22 | 22 | 21 | 21 | 19 | 12 | 08 |
| 06. | නුවරඑළිය | 22 | 22 | 22 | 22 | 22 | 22 | 22 | 22 | 21 |
| 07. | ගාල්ල | 33 | 33 | 32 | 31 | 31 | 31 | 30 | 26 | 20 |
| 08. | මාතර | 22 | 22 | 22 | 22 | 22 | 22 | 21 | 20 | 16 |
| 09. | හම්බන්තොට | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 15 | 13 |
| 10. | යාපනය | 15 | 13 | 15 | 15 | 15 | 15 | 15 | 15 | 14 |
| 11. | කිලිනොච්චි | 08 | - | - | - | 02 | 06 | 05 | 04 | 04 |
| 12. | මන්නාරම | 12 | 04 | 04 | 03 | 05 | 10 | 10 | 12 | 12 |
| 13. | වවුනියාව | 08 | 08 | 08 | 08 | 08 | 07 | 06 | 07 | 07 |
| 14. | මුලතිවු | 10 | - | - | - | 04 | 07 | 10 | 10 | 10 |
| 15. | මඩකලපුව | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| 16. | අම්පාර | 29 | 23 | 22 | 19 | 18 | 15 | 16 | 15 | - |
| 17. | ත්‍රිකුණාමලය | 22 | 22 | 22 | 22 | 22 | 22 | 22 | 22 | 20 |
| 18. | කුරුණෑගල | 55 | 54 | 54 | 54 | 54 | 54 | 55 | 54 | 54 |
| 19. | පුත්තලම | 18 | 18 | 18 | 18 | 18 | 18 | 18 | 18 | 15 |
| 20. | අනුරාධපුරය | 42 | 31 | 31 | 33 | 36 | 34 | 31 | 39 | 33 |
| 21. | පොලොන්නරුව | 13 | 09 | 09 | 11 | 11 | 10 | 10 | 09 | 05 |
| 22. | බදුල්ල | 31 | 31 | 31 | 31 | 31 | 31 | 30 | 27 | 26 |
| 23. | මොනරාගල | 18 | 16 | 16 | 17 | 17 | 14 | 14 | 09 | 07 |
| 24. | රත්නපුර | 30 | 29 | 29 | 29 | 28 | 26 | 26 | 19 | 20 |
| 25. | කෑගල්ල | 14 | 14 | 14 | 14 | 14 | 14 | 14 | 14 | 13 |
| **මුළු එකතුව** | | **559** | **502** | **499** | **500** | **507** | **506** | **503** | **475** | **410** |
| **ලැබිය යුතු සංඛ්‍යාව(හිඟ ගිණුම් වාර්තා)** | | | 29 | 32 | 31 | 50 | 51 | 54 | 82 | 147 |

- මුලතිව්, යාපනය, මන්නාරම, කිළිනොච්චි, වව්නියාව මධ්‍යස්ථානබොහෝමයක් යුද්ධය හේතුවෙන් අක්‍රීය වී ඇත.
- අනුරාධපුර සාලියපුර හාසම්පත් නුවර 2012 වසරේ ස්ථාපිත වී ඇත.
- මොනරාගල දිස්ත්‍රික්කයේ නෙල්ලියද්ද මධ්‍යස්ථානය 2008 වර්ෂයේ සහ සෙවනගල මධ්‍යස්ථානය 2009 වර්ෂයේ ආරම්භවී ඇත.
- 2007 දක්වා කොළඹ දිස්ත්‍රික්කයේ මධ්‍යස්ථාන ගණන 07 ක් පැවති අතර 2008 වර්ෂයේදී මධ්‍යස්ථාන ගණන 08 ක් වී 2011 වර්ෂයේදී මධ්‍යස්ථාන ගණන 09 ක් බවට පත්ව ඇත.
- හම්බන්තොට මයුරපුර මධ්‍යස්ථානය ආරම්භ වූයේ 2012 වර්ෂයේදීය.

**ඇමුණුම 05.**

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

2014 වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "**බී**" ගිණුම

විෂය අංකය 281011/281012

| | **වියදමෙහි උපරිම සීමාව (රුපියල්)** | **ලැබීම් වල අවම සීමාව (රුපියල්)** | **හර ශේෂයේ උපරිම සීමාව (රුපියල්)** |
|---|---|---|---|
| | | | |
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන් | 210,000,000.00 | 140,000,000.00 | 800,000,000.00 |
| වර්ෂ අවසානයේ සත්‍ය අගයන් | 190,035,519.63 | 140,862,646.03 | 388,621,476.96 |
| | | | |